## උහන ප්‍රාදේශීය සභාවේ පැවැති 07 වන සභා වාරයේ පනස්දෙවන සභා රැස්වීම් වාර්තාව

දිනය ඃ- 2022.07.14 පෙ.ව. 9.30

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 4. | ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 5. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 6. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 7. | ඊ.ආර් සුමනාවති මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 8. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 9. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 10. | පි.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 11. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 12. | එන්. එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 13. | එල්.ආර්. චන්ද්‍රසේකර බංඩාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 14. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 15. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 16. | ඒ. ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 17. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 18. | කේ.වි.පී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 19. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 20. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 21. | ජෙ.පි. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 22. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 23. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී |
| 24. | ඩබ්.ඩී. දර්ශන නුවන් | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

| | | |
|---|---|---|
| 1. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 2. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 3. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 4. | පි.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 5. | එන්. අමරකිර්ති මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 6. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදු රණවිරුවන් සිහි කිරීමෙන්ද පසු පෙ.ව. 9.30 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදි.

රැස්වීම ආරම්භයේදි ගරු මන්ත්‍රීවරුන් 16 දෙනෙක් පැමිණ සිටින ලදි.

| | | |
|---|---|---|
| 1. | ටී.පී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 3. | ඊ.ආර් සුමනාවති මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 4. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 5. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 6. | පි.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 7. | එන්. එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 8. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 9. | ඒ. ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 10. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 11. | කේ.වි.පී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 12. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 13. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 14. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 15. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 16. | ඩබ්.ඩී. දර්ශන නුවන් | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |

**1. පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාව ස්ථිර කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.47 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර්.චන්ද්‍රසේකර බණ්ඩාර මහතා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ගරු සභාපතිතුමනි සභාවේ න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කිරීමේදී ආගමික වශයෙන් තම තමන්ට අදාලව ආගම සිහිකරන බවත් ඊට අමතරව තිස් වසරක යුද්ධය නිමා කල රණ විරුවන් සිහිකිරීම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් පලකිරීම දිගටම කරගෙන පැමිණි දෙයක් බවත් ඔබතුමා ආගම සිහිකිරීම සිදු කරන්න යැයි ප්‍රකාශ කල නමුත් රණවිරුවන් සිහි කරන්න යැයි ප්‍රකාශ නොකල බවත් නමුත් අප නිශ්ශබ්දතාවයෙන් සිටි බවත් ඉන් පසු මා විසින් න්‍යාය පත්‍රය බැලූ බවත් න්‍යාය පත්‍රයේ ආගම සිහි කිරීමවත් රණවිරුවන් සිහි කිරීමවත් නොමැති බවත් එය මේ න්‍යාය පත්‍රයෙන් ඉවත් වී ඇති බව පෙනී යන බවද ප්‍රකාශ කරන ලදි.ඒ කුමක් නිසාදැයි ප්‍රකාශ කර සිටිනවා නම් ඉතා සාධාරණ බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

ආගම සිහි කිරීම හා රණවිරුවන් සිහි කිරීම අප විසින් දිගටම කරගෙන පැමිණි බවත්, සම්මතයක් ලෙස මෙය කරගෙන යාම සිදු කරන බවත්, න්‍යාය පත්‍රයේ ඇතුලත් කර නොතිබුණාට සභා වාර්තාවේ එය සඳහන් වන බවත්, න්‍යාය පත්‍රයට එය ඇතුළත් කිරීම අනවශ්‍ය බවත්, පලාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් සභා වාර්තාව සැකසීම පිළිබඳ වැඩසටහන් වලදී ප්‍රකාශ කර තිබෙන බවත් පෙන්වා දෙන ලදි.නමුත් එය අවශ්‍ය කාරණාවක් කියා හැඟෙන බැවින් ඊළඟ සභා වාරයේ සිට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු යොදන බව පැහැදිලි කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.48ට ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.එම්.ජයවීර රත්නායක මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.49ට ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ආරියරත්න දෙලංකාවල මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.50ට ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්.කුලතුංග මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.51ට ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.රාණි මැණිකේ මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

සභා වාර්තාව සකස් කිරීමේදී සිංහල ව්‍යාකරණ සම්බන්ධව මීට වඩා අවධානය යොමු කළ යුතු බවත්, නවක මන්ත්‍රී දර්ශන නුවන් මන්ත්‍රීතුමා ඔහු පිළිබඳ හඳුන්වා දෙන කතාවේ ඒරියා මැනේජර් වශයෙන් සඳහන් කළ දේ ඒ ආකාරයටම සභා වාර්තාවේ සඳහන් කර ඇති බවත්, එය ප්‍රාදේශීය කළමනාකරු ලෙස සඳහන් කිරීම සුදුසු බවත් එය නිවැරදි කරන ලෙස පෙන්වා දෙන ලදි.

**සංශෝධන 01.**

මාගේ නම ඩබ්.ඩී.දර්ශන නුවන් විශ්ණදේව බවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් මාගේ නම ඒ සඳහා නිර්දේශ කර ඇති බවත් මම සර්වෝදය ෆිනෑන්ස් ආයතනයේ ප්‍රාදේශීය කළමනාකරු වශයෙන් දැනට සේවය කරන බවත් මාගේ බිරිදද රජයේ නිළධාරිණියක බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය ප්‍රා.ස.මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහා ආසන හතරක් ලැබුණු බවත් පසු කාලීනව සිදුවූ පුරප්පාඩුවක් පිරවීම සඳහා අද දින මා පැමිණි බවත් ප්‍රකාශ කරන ලදි.පක්ෂයෙන් ගත් තීරණයක් ලෙස මා පත් කර ඇති බවත් එසේම සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරු සමඟ සුහදශීලිව වැඩ කිරීමට මට හැකියාව ලැබේවි යැයි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.රටේ දේශපාලන තත්වය අස්ථාවර තත්වයක තිබියදී මා හට මෙම පත්වීම ලැබුණු බවත් මීට මාස කීපයකට පෙර මෙම පත්කිරීම ලැබුණු බවත් නමුත් රටේ දේශපාලන අස්ථාවර භාවය හේතුවෙන් එය භාර නොගත් බවත් ප්‍රකාශ කරන ලදි.මට වයස 33 ක් වන බවත් අවුරුදු 33 දී ප්‍රා .ස.මන්ත්‍රීවරයකු වීමට ලැබීම පිළිබඳ ඉතාමත් සතුටුවන බවත් ප්‍රකාශ කරන ලදි.සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලය සමඟ හා ලේකම්තුමිය ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය සමඟ සුහඳව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවද ප්‍රකාශ කරන ලදි.මහජන නියෝජිතයෙක් ලෙස මාගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීමට මා බලාපොරොත්තුවන බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

මෙම සභා වාර්තාවේ කාරක සභා වාර්තා නැත යනුවෙන් සඳහන්ව ඇති බවත්, නමුත් මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව රැස් වූ බවත්, ඒම වාර්තා පසුගිය සභාවේ ඉදිරිපත් කළ බවත්, එය සභා වාර්තාවට ඇතුළත් විය යුතු බවත් පෙන්වා දෙන ලදි.

සංශෝධන **02.**

## 2022.05.25 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

සහභාගිත්වය ඃ-

1. ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා - සභාපති
2. ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා - සාමාජික
3. ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා - සාමාජික
4. ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී පී.ඒ. ඉමාලි සන්ධ්‍යා මිය - සාමාජික
5. ගරු ප්‍රා.ස. මන්ත්‍රී ආර්.එම්. ජයවීර රත්නායක මයා - සාමාජික
6. ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඒ. නන්දිකා ප්‍රියන්ති මිය - සාමාජික

කාර්ය මණ්ඩලය ඃ-

1. පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය, ලේකම් ප්‍රා.ස.
2. ඩබ්.එස්.ආර්. කුමාරි මිය, ප්‍රධාන කළ.සේවා නිල.

දැනට රට තුළ පවතින ආර්ථික තත්ත්වය මත සභාව වෙත ලැබිය යුතු ආදායම් අඩු වූ බැවින් සභාවේ ආදායම ඉහළ නංවා ගැනීම හා ඉන්ධන මිළ ගණන් නිරන්තරයෙන් ඉහළ යාම හේතුකොට ගෙන සභාව සතු වාහන කුලියට ලබා දීමේදී පවතින මිළ ගණන් පහත පරිදි සංශෝධන විය යුතු බව කමිටුව මඟින් නිර්දේශ කරන ලදි.

01. බැකෝ ලෝඩරය පැයකට රු. 6,500.00 යි. අවම පැය 02 විය යුතුය.
02. මෝටර් ග්‍රේඩරය පැයකට රු. 8,500.00 යි. අවම පැය 04 ක් විය යුතුය.
03. ට්‍රැක්ටරය දිනකට රු. 6,500.00 විය යුතුය.
04. ටොන් 01 ගල් රෝල දිනකට රු. 6,000.00 ක් ලෙසත් නවතා තැබීමේ ගාස්තු දිනකට රු. 1,000.00 විය යුතුය.
05. ටොන් 08 ගල් රෝල පැයකට රු. 5,500.00 ක් ලෙසත් අවම පැය 04 ක් විය යුතුය.

සභාව සතු ටිපර් රථය NEM කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත කුලියට ලබා දීමට ගරු සභාපතිතුමා විසින් එම ආයතනය සමඟ සාකච්ඡා කරන ලද අතර, මසකට රු. 125,000.00 ක මුදලකට සභාව වෙත ආදායම් ලබා දීමටත් ඉන්ධන එම ආයතනය විසින්ම සපයන බවත් ටිපර් රථයේ සුළු අලුත්වැඩියාවක් පමණක් සිදු කිරීමටත් එකඟ වන ලදි. සාකච්ඡා කළ පරිදි මසකට රු. 125,000.00 ක මුදලකට ඉන්ධන එම ආයතනය විසින් සපයා කුලියට දීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

## 2022.05.30 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

සහභාගිත්වය ඃ-

1. ගරු සභාපති ටී.පී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා - සභාපති
2. ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා - සාමාජික
3. ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා - සාමාජික
4. ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා - සාමාජික
5. ගරු ප්‍රා.ස. මන්ත්‍රිනි ඒ. නන්දිකා ප්‍රියන්ති මිය - සාමාජික

කාර්ය මණ්ඩලය ඃ-

1. පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය, ලේකම් ප්‍රා.ස.
2. ඩබ්.එස්.ආර්. කුමාරි මිය, ප්‍රධාන කළ. සේවා නිල.
3. ආර්.පී.ටී.පී. රාජපක්ෂ මයා, කළ.සේවා නිල.
4. යූ.පී.ඩී. උබේසිංහ මිය, සංවර්ධන නිලධාරී
5. කේ.ඒ.සී.එන්. පෙරේරා මිය, සංවර්ධන නිලධාරී
6. ඩබ්.සී.ඒ. ගලේවෙල මිය, සංවර්ධන නිලධාරී

2022 වර්ෂයට අදාලව කාර්යාලයට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිළ දී ගැනීම සඳහා භාණ්ඩ හා සේවා අවශ්‍යතාවයන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

### 1. සභාවට අයත් වසා ඇති කඩ කාමර ටෙන්ඩර් කිරීම

සභාවට අයත් උහන පොදු වෙළඳපොළ දැනට ආයතනය වෙත භාර දී ඇති කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. එහිදී කඩ කාමර කඩා ඉවත් කර නව කඩ කාමර පද්ධතියක් සකස් කිරීමට නියමිත බැවින් අදාල කඩ කාමර නැවත ටෙන්ඩර් නොකරන ලෙස 2021.12.23 දින සභාව මඟින් තීරණයක් ගන්නා ලදි. එමනිසා එම තීරණය අවලංගු කර නැවත එළඹෙන මහ සභාවකදී නව යෝජනාවක් ඉදිරිපත් කර වසා ඇති කඩ කාමර නැවත ටෙන්ඩර් කර ලබා දීමට සුදුසු බවද නිර්දේශ කරන ලදි. එහිදී නව ගිවිසුමක් සකස් කර සභාවේ නීතිඥ මහතාගෙන් උපදෙස් ලබා අතුරු බදුකරුවන් වෙත ලබා නොදී එම අදායම සභාව වෙත ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු බව කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

### 2. කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිළ දී ගැනීම

කාර්යාලයට අවශ්‍ය පහත සඳහන් ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිළ දී ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

1. A4
2. B5
3. CR 1,2,3 පොත්
4. ලියුම් කවර 6x4
5. ලියුම් කවර 9x4
6. ලියුම් කවර 10x7
7. ලියුම් කවර 16x12
8. ලියුම් කවර 12x10
9. ලියුම් කවර 15x20
10. ෆයිල් කවර
11. ෆයිල් කවර බොක්ස්
12. 2 ring ෆයිල්
13. ඩිමයි පේපර්
14. අඩි රූල්
15. බයින්ඩින් ටේප්
16. රතු ටේප් රෝල්
17. සබන්
18. ටෝනර් 230 A

19. පොඩි පොත්
20. ටෝනර් Konica Minolta 206
21. ටෝනර් HP Laser Jet
22. ටෝනර් Laser Jet PROAMP M 227 TDW
23. ටෝනර් Cannon LBP 6030
24. වර්ණ කාට්ලේජර්

මෙම උපකරණ මිළ දී ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි.

**3. විදී ලාම්පු මිළ දී ගැනීම**

01. බල්බ්
02. වයර් රෝල්

මෙම උපකරණ මිළ දී ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

**ඉහත මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තා වලින් ලබා දී ඇති නිර්දේශ සඳහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සහා අනුමැතිය ලබා දෙන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ජයතිලක මහතා විසින් සංශෝධන සහිතව සහා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා වාර්තාව සම්මත විය.**

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**03.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා -**

**යෝජනා අංක 05/2022/07(01)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් පියංගල හා සඳනඳපුර සුසාන භූමි ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ගරු සභාපතිතුමනි, සුසාන භූමි අඬා පනත යටතේ මේ සුසාන භූමි අපට හිමි බවත්, එසේ හිමි දේ නීත්‍යානුකූලව කර ගැනීමට අවශ්‍ය හෙයින් සභා අනුමැතිය ඉල්ලා සිටින නමුත් 2006 සිට සුසානභූමි පවරා ගැනීමට අදාල සභා තීරණ අරගෙන ඇති බවත් එම නිසා මෙය විහිළුවකට නොගන්නා ලෙසත් මායිම් පිළිබඳ ගැටළු සහගත තත්වයන් ඇති බවත් පෙන්වා දෙන ලදි. මෙසේ සුසානභූමි එකක් දෙකක් නොව උහන ප්‍රාදේශිය සභාවට අයත් සියළුම සුසාන භූමි පවරා ගැනීමට අදාළ කටයුතු කිරීම සඳහා ලෙස සඳහන් කර සභා අනුමැතියට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. එවිට ඒ සඳහා බලය එකවර ලබා ගත හැකි බවට පෙන්වා දෙන ලදී. මෙම සුසාන භූමි සභාවේ අරමුදල් යොදා මැනීම සිදු නොකරන ලෙසද ප්‍රකාශ කරන ලදී. මේ කියන සියළුම සුසාන භූමි උහන ප්‍රාදේශීය සභාවට පිරිසිදු කළ නොහැකි බැවින් මරණාධාර සමිති වලට ඒවා පැවරීම සිදුවිය යුතු බවද පෙන්වා දෙන ලදී. එමනිසා සභාවේ කමිටු වලට අවසරය ලබා දී ගම්වල මරණාධාර සමිති වලින් මුදල් වෙන් කර මැනුම් කටයුතු සිදු විය යුතු බවත් එවිට එම සමිති වලට හැඟීමක් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. උහන සුසාන භූමිය දැන් වල් වැදී ඇති බවත් වැටවල් පවා කඩා දමා ඇති බවත් පෙන්වා දෙන ලදී නීතිමය කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන බවත් මුදල් ගමේ මරණාධාර සමිතිය හරහා යොදාගෙන මැනුම් කටයුතු සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී. නමුත් සභාවෙන් මුදල් ගෙවා මේ කටයුතු සිදු කරනවානම් භූමදානය කරන සෑම මරණයක් සඳහාම රු. 500.00 ක මුදලක් සභාවට අයවිය යුතු බවත් එය නීතියක් ලෙස ක්‍රියාත්මක විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා.**

රංජිත් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව හොඳ බවත් රු. 500.00 ක් වැනි මුදලක් අය කිරීම හොඳ බවත් නමුත් ඊට පෙර අප විසින් කළ යුතු යුතුකම් කොටසක් තිබෙන බවත් වල් වැදී ඇති සුසාන භූමි වලින් එක පාරටම මුදල් අය කරනවා යැයි කියූ විට ප්‍රාදේශීය සභාව පිළිබඳ විශාල වැරදි චිත්‍රයක් පැන නගින බවත් පැහැදිළි කරන ලදී. මාස කීපයක් අපෙන් විය යුතු නඩත්තු කටයුතු සිදු කර මැනීම් කටයුතු සිදු කර පවරා ගැනීම් සිදු කර අවසන් වූවාට පසු යම් මුදලක් අය කිරීම සිදු වූවාට ප්‍රශ්නයක් නොමැති බවද පෙන්වා දෙන ලදී. ගම්වල තිබෙන මරණාධාර සමිති සුහදව මුණ ගැසී සාකච්ඡා කොට මෙය එම සමිති වල අදහසක් ලෙස ක්‍රියාත්මක කළ යුතු බවද පෙන්වා දෙන ලදී. එසේ නොකර එකවරම ගමේ භූමදානය කරන මරණයකින් මුදලක් අය කරන බව පවසා සිටිය හොත් ගමේ මන්ත්‍රීවරයාට පවා දැඩි විරෝධතාවයක් පැමිණෙන බව පෙන්වා දෙන ලදී. එමනිසා නිවැරදි වැඩපිළිවෙලකට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

උහන සුසානභූමිය ගැන කතා කල බවත් මාස කිහිපයක් උහන සුසාන භූමිය සුද්ද පවිත්‍ර කිරීම නොකළ බවත් වල් කැපීම සිදු කිරීමට දිනකට තෙල් ලීටර 5 ක් අවශ්‍ය බවත් තෙල් නොමැති නිසා තණ කොළ කැපීම සිදු නොකළ බවත් පෙන්වා දෙන ලදී. උහන සුසාන භූමිය නගරයට පෙනෙන සුසාන භූමියක් බැවින් එය ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු බව පෙන්වා දෙන ලදී. මන්ත්‍රීවරු පෙන්වා දෙන ආකාරයට සියලුම සුසාන භූමි ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ප්‍රාදේශීය සභාවෙන් සිදු කරන බවත් මැනීම් කටයුතු මරණාධාර සමිති හරහා කිරීමටත් කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. මීට පෙර සභ වාරයකදී මෙම සුසාන භූමි පිළිබඳ තීන්දුවක් අරගෙන ඇති බවත් මැනුම් කටයුතු සඳහා සභාවේ මුදල් යෙදීම සිදු කරන බවත් මරණාධාර සමිති හරහා එය සිදු කරන බවත් පෙන්වා දෙන ලදී.

සුසානභූමි පවරාගැනීම ප්‍රාදේශිය සභාවෙන් සිදු කිරීමට අනුමැතියත් ඒසඳහා මැණුම් කටයුතු වෙනුවෙන් දරණ මුදල් අදාල මරණාධාර සමිතිවලින් ලබා දීමට කැමැත්ත පලකර ඇති හෙයින් එම ආධාර මුදල් යොදා අදාල කටයුතු සිදු කිරීමට තීරණය විය.

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා අනුමැතිය ලබා දෙන ලදී.**

**යෝජනා අංක 05/2022/07(02)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් උහන කඩ කාමර අංක 01, 16, 23 ටෙන්ඩර් කිරීම සඳහා සහා අනුමැතිය සඳහා යෝජනා කර ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රීනී ඊ.ආර් සුමනාවතී මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

පැරණි ගිවිසුමේ කඩ කාමර ටෙන්ඩර් කිරීම සිදු නොවිය යුතු බවත් අලුතෙන් ගිවිසුම සකස් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. මේ පැරණි ගිවිසුමේ නීත්‍යානුකූල භාවයක් නොමැති බවත් එම කඩ කාමර ඉදිරියේදී අළුත්වැඩියා කිරීමක් සිදු කිරීමට සිදු වුවහොත් එම කඩ කාමර ලබා ගත් වෙළෙන්දන් ඉවත් කිරීමට සිදුවුවහොත් යම් කිසි කාල සීමාවකදී ඉවත් කිරීමට හැකිවන පරිදි යම් කාල රාමුවක් එයට යොදා අප සභාවේ නීතිඥ මහතාට ඉදිරිපත් කර ගිවිසුම අළුත් කර සකස් කිරීම සිදු විය යුතු බවත් පෙන්වා දෙන ලදී. එසේම මෙම කඩ කාමර කුලියට ගත් විට සමහර පුද්ගලයන් සිතා සිටින්නේ සදා කාලීකව ඔවුන්ට අයිති විය යුතු බවයි. එය එසේ නොවිය යුතු බවත් මෙය රජයේ දේපලක් බැවින් අවුරුදු 30 ක් 40 ක් සිටියත් මෙය හිමි නොවන බව පැහැදිලිව ඔවුන්ට ප්‍රකාශකර සිටිය යුතු බව පෙන්වා දෙන ලදි.ගිවිසුම් කාල සීමාව තුල පමණක් එය හිමි බව නිවැරදිව පැහැදිලිව සඳහන් විය යුතු බවද පෙන්වා දෙන ලදි.ගිවිසුම් උල්ලංඝනය කල පුද්ගලයකුට නැවත ටෙන්ඩර් කිරීමේදී ඉදිරිපත් විය නොහැකි බවද පැහැදිළි කරන ලදී. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ අප විසින් ක්ෂණික දැනුම් දීමකදී කිසිදු විකල්ප වලට යටත් නොවී ඉවත් විය යුතු බවයි. තවද අළුත්වැඩියා කළාට පසු එම පුද්ගලයාටම එය ලබා දිය යුතු යැයි නියමයක් නොමැති බවත් අළුතින් කඩ කාමර සකස් කළාට පසු සමස්ථ කඩ පද්ධතිය නැවත ටෙන්ඩර් කිරීම සිදු විය යුතු බවත් පැහැදිළි කරන ලදී. මෙම කරුණු ටික නිවැරදිව නිරවුල්ව ඇතුලත් කර ගිවිසුම සකස් කළ යුතු බව පැහැදිළි කරන ලදී. නීතිඥ මහත්මයෙකු මඟින් එම ගිවිසුම සකස් කර සභා ගත කරන ලෙසද ප්‍රකාශ කරන ලදී. එසේ කිරීම තුළින් යම් නීතිමය තත්ත්වයන් තුලදී වුව සාමූහික සභා තීරණයක් අරගෙන තිබෙන බව ඉදිරිපත් කළ හැකි බවද පැහැදිළි කරන ලදී. මොනයම් හේතුවක් නිසා කඩ කුලියට ගත් පුද්ගයන් අධිකරණමය කටයුත්තකට ගියහොත් ඒ සඳහා අප විසින් සාමූහිකව ගත් තීරණය ලේඛන ගතව තිබිය යුතු බවත් එය සභාවේ තීරණයක් බැවින් එය වෙනස් කළ නොහැකි බව අධිකරණයට පෙන්වා දිය හැකි පරිදි ලේඛන සකස් කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

කඩ කාමර පිළිබඳ කතා කරන විට පසුගිය දිනවල කඩ කාමර කුලී අතපසු කරන අයට දුරකතනය මගින් කතා කර මුදල් ලබා ගත් බවත් එම අවස්ථාවේ එම කමරය සඳහා රු.74200 ක් සභාවට ගෙවීමට ඇති බවත් දැන් එම කඩය සීල් තැබූ බවත් පැහැදිළි තරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ගිය සිකුරාදා උහන පොලේ මාකට් එකේ ඇතුලේ කොරිඩෝවේ ඇවිදින්න බැරි බවත් එය ආක්‍රමණය කර ඇති බවත් දැල් ගසා තහඩු ගසා කඩ සාදා ඇති බවත් කඩ එතනින් වසා ඇති බවත් පෙන්ව දෙන ලදි. මේ කඩ ගිය සිකුරාදා වසා ඇති බවත් කඩයක් දුන් පසු කඩය ඇතුලත පමණක් භාවිතා කලයුතු බවත් පදික තීරුව නිදහස් විය යුතු බවත් පෙන්වා දෙන ලදි.ගිවිසුමේ නීති උල්ලංඝනය කර ඇති බව පෙන්වා දෙන ලදි. අසල්වැසි කඩ වලටත් මෙය අවහිරයක් බවත් ඔවුන්ට මෙය විසදිය නොහැකි බවත් සභාව විසින් විසදා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**උහන කඩ කාමර ටෙන්ඩර් කිරීමට ප්‍රථම සභාවේ නීතිඥ මහතා මඟින් ගිවිසුම් අළුතින් සකස් කර කෙටුම්පත සභා අනුමැතියට ඉදිරිපත් කර සභා අනුමැතිය ලැබුණු පසු උහන කඩ කාමර ටෙන්ඩර් කිරීටට තීරණය විය.**

**යෝජනා අංක 05/2022/07(03)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්උහන සභාව වෙත පවරා දී ඇති සමනබැද්ද හෙල බොජුන් හල අඩු ආදායම්ලාභී රැකියා විරහිත දිරිය කාන්තාවන් සඳහා ආර්ථිකය නංවාලීමේ ස්වයං රැකියා අවස්ථා ලබා දීමට සහ සභාවේ ආදායම් උත්පාදන අරමුණු පෙරටුකර බොජුන් හල ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඩබ්.රාණි.මැණිකේ මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඩබ්.රාණි මැණිකේ මිය.**

දැනට මෙම හෙළ බොජුන් හලෙහි ආරක්ෂාවට සිවිල් ආරක්ෂක නිළධාරීන් යොදවා ඇති බවත් මේ වනවිට එහි දොරවල් දෙකක් ගලවා ඇති බව දැනුම් දී තිබෙන බවත් එම හෙළ බොජුන් හල ක්‍රියාත්මක කිරීමට සභාවෙන් අනුමැතිය ලබා දී තිබුනද එය ආරම්භ කිරීමට තව මුදල් ප්‍රමාණයක් අවශ්‍යය බවත් එම ස්ථානය රැකියාවක් වශයෙන් භාර දීමට අවශ්‍යය ක්‍රමවේදයක් තිබිය යුතු බවත් එම ක්‍රම වේදය තවම එහි නොමැති බවත් පෙන්වා දෙන ලදි.එහි තව අඩුපාඩු කිහිපයක් තිබෙන බවත් පෙන්වා දෙන ලදි.හිටපු රාජ්‍ය අමාත්‍ය ගරු ශ්‍රියානි විජේවික්‍රම මැතිණියගේ වෙන් කරන ලද මුදලින් මෙම හෙළ බොජුන් හල සෑදූ බවත් නමුත් එහි යම් යම් අඩුපාඩු පවතින බවත් රැකියාවක් ලෙස භාරදීමේ ක්‍රමවේදයේ අඩුපාඩු පවතින බවත් පෙන්වා දෙන ලදි.මේ සඳහා සභාවේ මුදල් නොමැති බව ප්‍රකාශ කල බවත් කවුරුන් හෝ මුදල් ප්‍රතිපාදන වෙන් කර ඉතිරි ටික සකස් කර ගැනීමට උදව් කරනවානම් ඉතා හොඳ බවද පෙන්වා දෙන ලදි.රැකියාවල් ලබා දෙනවා නම් කාන්තාවන් 16 කට රැකියාවල් ලබාදිය හැකි බව පෙන්වා දෙන ලදි. ඉතා ඉක්මනින් මෙය ආරම්භ කිරීමට වැඩ පිළිවෙලක් යෙදීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

මෙම හෙළ බොජුන් හල ආරම්භ කිරීමට සභා අනුමැතිය ලබා ගෙන තිබුනද තවම එය ආරම්භ කිරීමට නොහැකි වීම නිසා මිනිසුන් ගෙන් එම මුදල් අරගෙන මෙම කාර්ය අවසන් කල නොහැකි බවත් මේ සඳහා ලොකු පිරිවැයක් දැරීමට සිදුවන බවත් ගෑස් හා ලිප් ආදී දේවල් අවශ්‍ය බවත් තවත් උපකරණ රාශියක් අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදී. ඉදිරියේදී එන ව්‍යාපෘතියක් මඟින් හෝ මෙම අඩු පාඩු ටික සකස් කර මෙම හෙළ බොජුන් හළ ආරම්භ කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. මෙය කාටවත් ලියාදිය නොහැකි බවත් අපි විසින් උපකරණ පද්ධතිය අරගෙන දිය යුතු බවත් හෙළ බොජුන් හලේ අය ද්‍රව්‍ය ගෙනවිත් කෑම සාදා ඒවා විකිණීම සිදු කර යම් මුදලක් සභාවට ගෙවිය යුතු බව පෙන්වා දෙන ලදී. එහිදී දිනපතා යන ගෑස් වලට හා විදුලියට යම් මුදලක් එකතු කළ යුතු බවත් පැහැදිළි කරන ලදී. ඒ සඳහා කමිටුවක් සෑදිය යුතු බවත් ඔවුන් විසින් මේ සියල්ලම කළමනාකරණය කළ යුතු බවත් පැහැදිළි කරන ලදී.

**ඒ අනුව ඉදිරි ව්‍යාපෘතියක් මඟින් හෝ සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන් හා මුදල් මඟින් මෙම හෙළ බොජුන් හල අඩුපාඩු සකස් කර සංවර්ධනය කිරීමට තීරණය වූ අතර, ඒ සඳහා කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය.**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා අනුමැතිය ලබා දෙන ලදී.**

**යෝජනා අංක 05/2022/07(04)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් LDSP ව්‍යාපෘතියේ PT 2 ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

1. JCB යන්ත්‍රය අළුත් වැඩියා කිරීම (Repairing the JCB Machine)
2. රජගලතැන්න පාළමට ප්‍රවේශවීමේ හැකියාව වැඩි දියුණු කිරීම (Improvement of Accessibility to the Bridge of Rajagalathenna)

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එන්.එච්. ලාල් ජයන්තසිරි මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ජී. දෙලංකාවල මහතා**

ගරු සභාපතිතුමනී, මෙම ව්‍යාපෘතියෙන් එවා ඇති මුදල එක එක කාණ්ඩ වලට වෙන්වෙන බව ඔබතුමා ප්‍රකාශ කළත් ඒවා වෙන වෙනම සභාවට පැහැදිළිව ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී කේ.වී.ජී. නයනා කුමුදුනී මිය**

දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට යම්කිසි මුදලක් සභාවට ලැබී තිබෙනවානම් ඒවා වියදම් කළ යුත්තේ මේ මේ ක්ෂේත්‍රයන්ට අදාළව යැයි සභාගත කළා නම් සභාවෙන් ඵලදායි අදහස් පැමිණිය හැකි බව ප්‍රකාශ කරන ලදී. දැන් නිකම්ම මෙවැනි මුදලක් ලැබී තිබෙනවා යැයි පැවසුවාට අපට පැහැදිළි නොවන බවත් පෙන්වා දෙන ලදී. ව්‍යාපෘතියේ අරමුණු අනුව කුමන ක්ෂේත්‍රය හරහා වියදම් කළ හැකිද යන්න සභාවට පැහැදිළි කර ඉදිරිපත් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේ වූවා නම් වඩාත් ඵලදායී යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදාවන බව පෙන්වා දෙන ලදී. ඒ පිළිබඳ පැහැදිළි කිරීමක් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා අනුමැතිය ලබා දෙන ලදී.**

**යෝජනා අංක 05/2022/07(05)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් පසුගිය කාල වකවානුවේ පැවැති සහ වර්තමානයේ පවතින ගැටළු සහගත තත්ත්වයන් හේතුවෙන් සභාවේ ආදායම් උත්පාදන කාර්යයන් අඩාල වූ හෙයින් පවතින වියදම් දැරීම සඳහා සභාව සතු 1896001000089030 අංක දරණ මහජන බැංකුවේ තැන්පත් කර ඇති ස්ථාවර තැන්පත් ගිණුමෙන් මුදල් ලබා ගෙන වියදම් දැරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු සභාපතිතුමා**

මේ වන විට රු. 170.00 ට තිබුණු ඉන්ධන ලීටරය රු. 470.00 වැනි මුදලක් වී ඇති බවත් එයට සමගාමීව සියළුම භාණ්ඩ වල මිළ ඉහළ ගොස් ඇති බැවින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයට අනුව 2021.12.31 දිනට වඩා භාණ්ඩ වල මිළ ඉහළ ගොස් ඇති බවත් පෙන්වා දෙන ලදී. ලක්ෂ විසි දෙකක් හෝ විසි තුනක් ගෙවීමට ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මුද්දර මුදල් වලින් ඉන්ධන බිල්පත් ටිකක් ගෙවූ බවත් ප්‍රකාශ කරන ලදී. 2021 වර්ෂයේ මුද්දර මුදල් තවම ලැබී නැති බවත් උසාවි දඩ මුදල්ද යම් ප්‍රමාණයක් ලැබිය යුතු බවත් පෙන්වා දෙන ලදී. එම මුදල් ලැබුණු පසු පියවන පදනම මත සභා අනුමැතිය ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

සභාවේ ස්ථාවර තැන්පතු ගණන හා වටිනාකම විමසන ලදී. අප විසින් සකසන ලද අයවැයෙහි එම ගිණුම් සඳහන් කර තිබෙනවාද යන්න විමසන ලදී.

**ගරු සභාපතිතුමා**

ස්ථාවර තැන්පතු 02 ක් තිබෙන බවත් එකක වටිනාකම රුපියල් ලක්ෂ දහඅටක් වන බවත් අනෙක් ගිණුමේ වටිනාකම ලක්ෂ විසි එකක් බවත් ප්‍රකාශ කරන ලදී. එක ගිණුමක් අයවැයෙහි සඳහන් කර නැති බව ප්‍රකාශ කරන ලදී. සෝලා ලයිට් ලබා ගැනීමට සභා අනුමැතියක් අරගෙන ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගත් බවත් එමනිසා අයවැයට ය ඇතුලත් නොකළ බවත් දැන් නැවත එම මුදල් ලැබුණු නිසා ස්ථාවර තැන්පතුව ආරම්භ කළ බවත් පැහැදිළි කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

අයවැය ලේඛනයට එම ගිණුම් ඇතුලත් විය යුතු බවත් ගිණුමේ රුපියලක් හෝ තිබෙනවානම් එය සඳහන් විය යුතු බව පැහැදිළි කරන ලදී. සභාවේ තීන්දු වලට මම එකඟ බවත් නමුත් මෙම යෝජනාවට මම පෞද්ගලිකව මාගේ ඡන්දයවත් කැමැත්තවත් ලබා නොදෙන බව ප්‍රකාශ කරන ලදී. මෙම මුදල් හුවමාරු කරන කාර්යයට මම කැමැත්ත ප්‍රකාශ නොකරන බවත් එමනිසා එයට මාව බැහැර කර අනුමැතිය සඳහන් කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී. මේ ගිණුම් පිළිබඳව පැහැදිළිතාවයක් නොමැති නිසා එසේ කරන බව ප්‍රකාශ කරන ලදී. එයට කැමති නොවන බවත් ඔබතුමාලා කැමති තීන්දුවක් ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී. පැහැදිළිව අර්ථ දක්වා තිබුනානම් තීන්දුවක් ගැනීමට තිබුණු බව පෙන්වා දෙන ලදී. මේ තිබෙන ගිණුම් පිළිබඳව පැහැදිළිව වෙන වෙනම සභාව දැනුවත් කළ යුතු බව පෙන්වා දෙන ලදී. ගෙවීමට ඇති බිල්පත් වල විස්තරද දැන් අවශ්‍ය බවත් කොපමණ මුදල් ප්‍රමාණයක් ඒවා පියවීමට අවශ්‍යද යන්නත් මොන මොන දේවල් සඳහා ද ගෙවීම් කිරීමට ඇත්තේ යන්නත් වෙන වෙනම අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

ගරු සභාපතිතුමනි, මීට ටික කාලයකට පෙර ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතු සඳහා පොළි අනුපාත අඩු බැවින් රටේ පොළි අනුපාත වරින් වර වෙනස් වන බැවින් මේ වන විට 20% ක් වැනි ප්‍රමාණයකට පොළි අනුපාත වෙනස් වී ඇති බවත් එසේ පොළී අනුපාත වැඩි වන විට මෙම ස්ථාවර තැන්පතු කඩා වෙනස් කිරීමට ක්‍රමවේදයක් යොදා තිබෙනවාදැයි විමසන ලදී.

**ගරු සභාපතිතුමා**

එසේ ක්‍රමවේදයක් යොදා නොමැති බවත් එසේ ක්‍රමවේදයක් යොදනවානම් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

ඒ පිළිබඳ කිසිම අවධානයක් යොමු නොකරන ලද බව පැහැදිළිවන බවත් මෙතන ලක්ෂ තිස්නවයක් තබෙන බැවින් පොළි අනුපාත වැඩි වන විට ගිණුම වෙනස් කිරීම සිදු කරනවානම් විශාල වශයෙන් පොළිය වැඩි වන බවත් එය සභාවට වාසිදායක බවත් පැහැදිළි කරන ලදී. රාජ්‍ය බැංකු ගත් විට තරඟකාරීත්වය බලා වැඩි පොළියක් දෙන රාජ්‍ය බැංකුවක මෙම ගිණුම් පවත්වාගෙන යනවානම් සුදුසු බව පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව සභාපතිතුමා හා ලේකම්තුමිය අවධානය යොමු කර නොමැති බව හැඟී යන බව එසේ අවධානය යොමු නොකිරීම තුළින් ලක්ෂ දහයක් පමණ සභාවට පාඩුවී ඇති බව පෙන්වා දෙන ලදී. මේ

පිළිබඳ අවධානය යොමු කර අදම සභාවේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක වීම සුදුසු බව පෙන්වා දෙන ලදී. අපට සුරක්ෂිතයි කියා සිතෙන වැඩි පොළියක් ගෙවන රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුව දැමීම සුදුසු බව ද පෙන්වා දෙන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.55 ට ගරු උපසභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා පැමිණ අසුන් ගන්නා ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.58 ට පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි පිටවී යන ලදී.

**ගරු සභාපතිතුමා**

කඩ කාමර කුලී තැන්පතු ගිනුමේ රුපියල් 1,586,000.00 තිබෙන බවත් අනෙක් ස්ථාවර තැන්පතු ගිණුමේ රු. 2,063,000.00 තිබෙන බවත් පැහැදිලි කරන ලදි.රු.1,500,000.00 කින් පටන් ගත් ගිණුමේ දැන් රු.2,063,000.00 ලැබී ඇති බවත් පෙන්වා දෙන ලදි. එම ගිණුමෙන් මුදල් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය අවශ්‍ය බවත් රු.2,000,000.00 වැනි ප්‍රමාණයක් බිල්පත් පියවීමට තිබෙන බැවින් එයට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එම ගිණුමෙන් කොපමණ මුදලක් ලබා ගන්නවාද යන්න සභාවෙන් තීන්දුවක් අවශ්‍යය බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

අපේ තිබෙන ණය ප්‍රමාණය පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍යය බවත් හදිසියේ ගෙවිය යුතු ණය ප්‍රමාණය මොන මොන දේවල් සඳහා බිල්පත් ගෙවීමට තිබෙනවාද යන්න පිලිබද පැහැදිලි කිරීමක් අවශ්‍යය බව ප්‍රකාශ කරන ලදි. ඊට අමතරව ඉදිරියේදී කරන්නට විශේෂ කටයුතු තිබෙනවාද යන්න පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.මාස දෙක තුනක බිල්පත් තව මාස කීපයක් ඉදිරියට තියාගත හැකිද ඊට කලින් බිල්පත් හදිසියේම ගෙවිය යුතු බැවින් ඒවා පිළිබදවද වෙන වෙනම පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.05 තේ විවේකය සඳහා සභාව කල් තබන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.40 තේ විවේකයෙන් පසු සභාව ආරම්භ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

දෙලංකාවල මන්ත්‍රීතුමා හා රංජිත් මන්ත්‍රීතුමා කොපමණ බිල්පත් තිබෙනවාද යන්න විමසූ ප්‍රශ්න වලට පිළිතුරු ලෙස වවුචරයෙන් වවුචරයට වෙන වෙනම සකස්කර ඉදිරිපත් කළ යුතු දැයි විමසන ලදී. එසේ අවශ්‍ය නොවනවානම් සාරාංශ වශයෙන් ඉදිරිපත් කිරීම සිදු කරන්නම් යැයි ප්‍රකාශ කරන ලදී. සභාවේ වාහන සඳහා ඉන්ෂුවරන්ස් ගත යුතු බවත් ඒ සඳහා ලක්ෂ හතරක් වැනි මුදලක් වැය වන බවත් ප්‍රකාශ කරන ලදී. ටිපර් රථයට පමණක් ඉන්ෂුවරන්ස් අරගෙන තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

ඔබතුමා ඉන්ධන සඳහා රුපියල් හය ලක්ෂ ප්‍රමාණයක් ගෙවීමට තිබෙන බව ප්‍රකාශ කළත් ඔබතුමා මීට පෙර පැවසුවේ මුද්දර මුදල් වලින් ඉන්ධන බිල්පත් පියවූ බවයි. තෙල්වල පාරිභෝජනය සම්බන්ධ ලේඛන මේ සභාවට ඉදිරිපත් නොකරන බවත් JCB යන්ත්‍රයේ ධාවන සටහන් වාර්තාව හැර අනෙක් වාහන වල ධාවන සටහන් වාර්තා අද දිනයේ ලැබී ඇති බවත් නමුත් වැඩිම ඉන්ධන වියදමක් සිදුවන්නේ JCB යන්ත්‍රයේ බවත් නමුත් එම JCB යන්ත්‍රයේ ධාවන සටහන් ඉදිරිපත් කරන්නේ නැතිව ඉන්ධන බිල්පත් ගෙවීම සඳහා සභා අනුමැතියක් ලබා දෙන්නේ කෙසේදැයි විමසන ලදී. පසුගිය මාසයේ අප විසින් පවසා සිටියේ ධාවන සටහන් ඉදිරිපත් නොකරන වාහන සඳහා අනුමැතිය ලබා නොදෙන බවයි. ලීටර එක්දහස්

ගණනක JCB යන්ත්‍රයට ඉන්ධන යොදා ඇති බවත් එහි ධාවන සටහන් නොමැති නිසා ඉන්ධන බිල්පත් පියවීමට සහා අනුමැතිය ලබා නොදෙන බවත් මේ සඳහා මා සම්පූර්ණයෙන්ම විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු උපසභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

ගරු සභාපතිතුමා මේ සභාවට ඉදිරියේදී කවුරු ඒවිද කියා නොදන්නා බවත් රට ණය බරට දා රාජපක්ෂලා ගෙදර ගියා යනුවෙන් පවසන බවත් ඒ ආකාරයට අපිත් ගෙදර යන විට සභාව ණය කරලා අපට යාමට නොහැකි බවත් මෙහි ණය තිබෙනවානම් ඒවා පියවිය යුතු බව මාගේ මතය බවත් ප්‍රකාශ කරන ලදී. ණය තියාගත නොහැකි බවත් මේ වනතුරු ගෙවීමට තිබෙන බිල්පත් ගෙවා නිදහස් විය යුතු බව පෙන්වා දෙන ලදී. මේ වේලාවේ ආදායම් එකතු කිරීමේ ප්‍රශ්ණයක් ඇති බැවින් සභාවේ ස්ථාවර තැන්පතුවෙන් සභාවේ වත්කම්වලින් එය පියවීම සුදුසු බව පැහැදිලි කරන ලදී.සභාවේ වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම නිසා ඉන්ධන පිරවුම්හලට ණය වී ඇති බවත් අප ගෙදර පරිහරණයට ඒවා ලබා ගෙන නොමැති බවත් සභාවේ කාර්යයන් සඳහා වාහන ධාවනය සිදුකරන නිසා එසේ සිදු වී ඇති බැවින් එම ණය මුදල් පියවිය යුතු බවත් පැහැදිලි කරන ලදී.සභාවේ වත්කම් වලින් මේ මුදල් පියවිය යුතු බවත් ණය බරට තබා නොයන ලෙස පැහැදිලි කරන ලදී.අපි ගෙදර යනවිට නිවැරදිව යායුතු බැවින් සභාවේ ආදායමින් හෝ සභාවේ වත්කම් වලින් මෙම ණය ගෙවා අවසන් කලයුතු බව ප්‍රකාශ කරන ලදී.මෙය මහජනතාවගේ දේපල බැවින් අප නිදහස් විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

ගරු උපසභාපතිතුමාගේ කතාව මමත් අනුමත කරන බවත් මේ සභාව තව කොපමණ කල් පවතීවිදැයි නොදන්නා බවත් අපේ කාලයේදී යම් ණයක් වී තිබෙනවානම් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එසේම ආදායමින් හෝ ස්ථාවර තැන්පතුවෙන් හෝ ගෙවන දේවල් ප්‍රථමයෙන්ම හඳුනාගත යුතු බව පැහැදිලි කරන ලදී.අළුතින් පැමිණි නිළධාරීන්ට දසමස් ණය දෙන්න යන බව ආදී ආරංචි වන බවත් ඒවා එසේ නොවිය යුතු බවත් පැහැදිලි කරන ලදී.එවැනි දේවල් ආදායම් හොයාගෙන ගෙවිය ගෙවිය හැකි බවත් පෙන්වා දෙන ලදී.ස්ථාවර තැන්පතුවෙන් ගෙවීම් කල හැක්කේ දැනට තිබෙන ණය මුදල් පියවීමට පමණක් බවත් ඒ සඳහා අප විසින් අනුමැතිය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.එහිදීද ආසන්න මාසය අතහැර ගෙවීම් සිදුකල හැකිනම් හොඳ බවද පෙන්වා දෙන ලදී.එසේම විවිධ ණය කියන එක ඔබතුමා විසින් පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදී.එසේ පැහැදිලි කිරීම අවශ්‍යය බව ප්‍රකාශ කරන ලදී.එසේම සභාවේ සේවකයන් යුතුකම් පැහැර හැර තිබෙනවා නම් හෝ ධාවන සටහන් ඉදිරිපත් නොකරන්නේ නම් එයට හේතුව ලේකම් තුමිය විසින් දැන් පැහැදිලි කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මහතා.**

උප සභාපතිතුමා හා දෙලංකාවල මන්ත්‍රීතුමා පවසා සිටින දෙය ඉතා පැහැදිලි බවත් එසේම රංජිත් ඒකනායක මන්ත්‍රීතුමා පවසා සිටින කාරණාව නම් ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීම සිදු නොකරණ ලෙසයි.එයට හේතුව ලෙස අප දකින්නේ වෙනත් වෙනත් ක්‍රියාමාර්ග වලටත් මේ මුදල් යොදවන නිසා බව පැහැදිලි වන බවයි.එම නිසා මේ බිල්පත් සඳහා පමණක් මෙපමණ මුදලක් අවශ්‍යය යැයි නිවැරදිව පැහැදිලිව ඔබතුමා මේ සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.එම හේතු කාරණාවලට ඇරෙන්න වෙනකිසිම කාරණාවකට ස්ථාවර තුන්පතුවේ මුදල් වියදම් කිරීමට තහනම් බව පැහැදිලි කරන ලදී.මේ තියෙන තත්වය අනුව එම බිල්පත් පියවීමට පමණක් අනුමැතිය ලබා දෙමු යැයි පවසා සිටින ලදී.මෙතුමා ගිය සභා වාරයේදී ධාවන සටහන් ඉල්ලූ බවත් නමුත් මේ සභාවාරයේදීවත් එය ලබාදීමට නොහැකි වී ඇති බව ඇති බව පෙන්වා දෙන ලදී. JCB එකෙන් ඉපයුවට JCB එක සඳහා ඉන්ධන ලබා දීමට අපි විසින් අනුමැතිය ලබා නොදෙන බව ප්‍රකාශ කරන ලදී. JCB එක වැඩ කරේ නැත්නම් ඉන්ධන ලීටර් එක්දහස් ගනනට මොකද වුනේ යැයි විමසන ලදී.නමුත් දැනට තිබෙන ණය ටික ගෙවීමට පමණක් සාදාරණ තීන්දුවකට පැමිණ අනුමැතිය ලබා දෙමු යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්.ජගත් ප්‍රසන්න මහතා.**

මේ කාරණාවට පොඩි අදහසක් එකතු කල යුතු බවත් ඔබතුමා ආවේගශීලීව කතා කලා.ඔබතුමාට යම් පීඩනයක් මේ සම්බන්ධව තිබෙනවා වෙන්නට පුළුවන් බවත් එසේම මන්ත්‍රීවරු ලෙස අපටත් පීඩනයක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.මේ සභාව මේ අවුරුදු 4 තුළ නිවැරදිව ආවාද යන්න අපට ගැටළුවක් තිබෙන බවත් හැමදාම එකම දේ සාකච්ඡා වන බවත් මේ සභාවාරයේ කතාකරන දේ ඊලග සභාවාරයේත් ඒකම කතා වන බවත් පෙන්වා දෙන ලදි.එම නිසා මේ මන්ත්‍රීවරුන්ට යම් කුකුසක් තිබෙන බව පෙන්වා දෙන ලදි.කවුරුවත් නීතිමය ක්‍රියා මාර්ග වලට යාමට අකමැති බව පෙන්වා දෙන ලදි.නමුත් මේ මුදල් ගෙවිය යුතු බැවින් උප සභිපතිතුමා හා දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ පරිදි මේ ණය මුදල් ගෙවීම සිදුකල යුතු බව ප්‍රකාශ කරන ලදි.අවංකවම ගෙවියයුතු මුදල් ගෙවිය යුතු බැවින් එම බිල්පත් පියවීම කලයුතු බවත් නමුත් ගෙවිය යුතු මුදල කොපමණද ? කුමන කාරණාවක් සදහාද ගෙවන්නේ යන්න මේ සභාවේ හැම දෙනාම දැනගත යුතු බව පැහැදිලි කරන ලදි.අත්‍යාවශ්‍යම කාරණා මොණවාද ?ඒවා ගෙවිය යුත්තේ ඇයි?යන්න දැනුවත් කරන ලෙස පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

හදුනාගත් ණය ගෙවන ගමන් මෙම මාසය අතහැරලා ඊට පෙර ණය පමණක් ගෙවන ලෙසත් එසේම අපට යම් ප්‍රධානයක් ලැබුණු ගමන් මුද්දර මුදල් හෝ උසාවි දඩ හෝ යම් මුදලක් ලැබුණු පසු සභාවේ වියදම් වලට අමතරව ඉතිරි වන මුදලින් ස්ථාවර තැන්පතුව පියවීම සිදු විය යුතු බව පැහැදිලි කරන ලදි.

**ගරු උපසභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

අපට අය වීමට යම් මුදලක් මුද්දර මුදල් හා උසාවි දඩ මුදල් ආදිය හැකිතාක් ඉක්මනින් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.ආදායම් කෙසේ හෝ ලබාගත යුතු බවත් දෛනික වියදම් අඩුකරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.මේ මාසයේ බිල්පත් ඉතුරු කර පෙර මාසවල ගෙවිය යුතු බිල්පත් ගෙවීම් සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ගරු උපසභාපතිතුමා හා දෙලංකාවල මන්ත්‍රීතුමා ජගත් ප්‍රසන්න මන්ත්‍රීතුමා දැක්වූ කරුණු ඇත්ත බවත් 2018 වර්ෂයේ අපි මේ සභාවට පැමිණි බවත් එහිදී මේ සභාව ණය වෙලාද තියෙන්නේ ඉස්සර හිටිය අය හොරුද නැද්ද කවුරුවත් ප්‍රශ්ණ නොකල බවත් ඇවිත් වාඩිවී මේ කාර්ය කරගෙන ගිය බවත් නමුත් දීර්ඝ කාලීනව සිටිය පිරිසක් ලෙස මේ සභාවේ සෑම දේම දන්නා බවත් ප්‍රකාශ කරන ලදි.පාලන ක්‍රමයේ දුර්වලතාවයකින් හෝ මොනයම් හේතුවකින් ආදායම් උත්පාදනය අඩු වීඇති නිසා බිල්පත් ගෙවීමට ක්‍රම වේදයක් නොමැති වී ඇති බව ප්‍රකාශ කරන ලදි.නමුත් දැන් මෙම ගෙවීම් බිල්පත් වල ලක්ෂ දහයකට ආසන්න තෙල් බිලක් තිබෙන බවත් එම ඉන්ධන සදහා යාන්ත්‍රනයේ ධාවන සටහන් ඉදිරිපත් කිරීමට හැකියාවක් නැත්නම් එය ප්‍රශ්ණයක් බවත් ඔබතුමාලා ඔනම තීන්දුවක් ගන්නා ලෙසත් මම කතා කලේ සත්‍ය බවත් මම මේ සම්බන්ධව නැවත කතා නොකරන බවත් මෙම යෝජනාවට මාගේ එකඟතාවයක් නොමැති බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

පියවීමට ඇති වවුචර් පත් සභා ගත කරන ලදි.

**ගෙවීමට ඇති වවුචර් පිළිබඳ විස්තරය**

| | දිනය | කාරණය | නම | විස්තරය | මුදල |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2022.07.19 | **විවිධ** | සියනෑ ස්ටෝර්ස් | ඉදල්01 ගම් 01 සොකට් 01 මිලදී ගැනීම | **Rs. 1,987.50** |
| 2 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | ජල නල පද්ධතිය සඳහා උපාංග මිලදී ගැනීම | **Rs. 3,676.00** |
| 3 | | | ඩී.එස්.අයන් වර්ක්ස් | ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම | **Rs. 3,585.00** |
| 4 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | ඉදිරිපස වැටෙහි ආලේප කිරීම සඳහා තීන්ත හා උපකරණ පුස්තකාලය ඉදිරිපිට ජල කරාමය සැකසීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම තණ කොළ කපන මැෂිමට බුල් රෝල ට්‍රැක් මිලදී ගැනීම | **Rs. 3,904.00** |
| 5 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | පිටුපස ප්‍රධාන ගේට්ටුව ඉදිරිපස කුඩා ගේට්ටුව මුරකාමරයේ මේසය සඳහා ඉබි යතුරු සහ දම්වැලක් මිලදී ගැනීම | **Rs. 4,829.00** |
| 6 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | ඉදිරිපස ප්‍රධාන ගේට්ටුව සඳහා ඉබි යතුරු මිලදී ගැනීම | **Rs. 3,933.00** |
| 7 | | | උදාර හාඩ්වෙයාර් | කාර්යාලයේ ප්‍රධාන දොර සඳහා ලොක් එකක් මිලදී ගැනීම කටර් අඬුවක් ටෙස්ටරයක් මිලදී ගැනීම | **Rs. 4,075.00** |
| 8 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | උහන ත්‍රිවිල් රථ ගාල ඉදි කිරීමට භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | **Rs. 4,415.00** |
| 9 | | | කොඩිතුවක්කු හාඩ්වෙයාර් | උහන ත්‍රිවිල් රථ ගාල ඉදි කිරීම සඳහා අමානෝ ඇණ මිලදී ගැනීම | **Rs. 4,950.00** |
| 10 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | උහන ත්‍රිවිල් රථ ගාල ඉදි කිරීම සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගැනීම | **Rs. 4,920.00** |
| 11 | 2022.07.21 | | ලේකම්,නගර සභාව, අම්පාර | කසල එකතු කර කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත භාර දීම(පෙබරවාරි) | **Rs. 11,400.00** |
| 12 | | | ලේකම්,නගර සභාව, අම්පාර | කසල එකතු කර කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත භාර දීම(මාර්තු) | **Rs. 13,200.00** |
| 13 | | | ලේකම්,නගර සභාව, අම්පාර | කසල එකතු කර කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත භාර දීම(අප්‍රේල්) | **Rs. 10,800.00** |
| 14 | | | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් | උහන ත්‍රිවීල් රථගාල ඉදිකිරීම සඳහා අවශ්‍ය භාන්ඩ හා උපකරණ මිලදී ගැනීම | **Rs. 4,920.00** |
| 15 | | | කළන ඉංජිනියරින් ටෙක්නොලජී | උහන ත්‍රිවීල් රථගාල ඉදිකිරීම සඳහා **2" GI** බට එකක් නැවීම සඳහා කුළිය | **Rs. 1,400.00** |
| 16 | | | කළන ඉංජිනියරින් ටෙක්නොලජී | උහන ත්‍රිවීල් රථගාල ඉදිකිරීම සඳහා **2" GI** බට **03** ක් නැවීම සඳහා කුළිය | **Rs. 4,200.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | | | කළන ඉංජිනියරින් ටෙක්නොලජී | උහන ත්‍රීවිල් රථගාල ඉදිකිරීම සඳහා 2" GI බට 03 ක් නැවීම සඳහා කුළිය | **Rs. 4,200.00** |
| 18 | | | කළන ඉංජිනියරින් ටෙක්නොලජී | උහන ත්‍රීවිල් රථගාල ඉදිකිරීම සඳහා 2" GI බට 03 ක් නැවීම සඳහා කුළිය | **Rs. 4,200.00** |
| 19 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | වීදි ලාම්පු අලුත්වැඩියාව සඳහා CFL බල්බ් (23W) මිලදී ගැනීම 750*150 | **Rs. 112,500.00** |
| 20 | | | සියනෑ ස්ටෝර්ස් | 2022 ජුනි මාසයේ මාසික සභා රැස්වීමට උදැසන තේ ලබාදීම | **Rs. 1,267.50** |
| 21 | | | සියනෑ බිල්ඩින් මෙටිරියල් සෙන්ටර් | උදලු තල හා ඉබි යතුරු මිලදී ගැනීම | **Rs. 4,850.00** |
| 22 | | | සියනෑ බිල්ඩින් මෙටිරියල් සෙන්ටර් | වෑල්ඩින් කූරු, බ්‍රෂ් ෂෝඩු , ෂවර් මිලදී ගැනීම | **Rs. 2,021.21** |
| 23 | | | 'A.H.M ෆාරිස් | ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර් මිලදී ගැනීම | **Rs. 68,000.00** |
| 24 | | | සියනෑ ස්ටෝර්ස් | ප්‍රාදේශීය සභා භූමිය වටා කම්බි වැට ඉදිකිරීම භාන්ඩ හා ද්‍රව්‍ය මිලදී ගැනීම | **Rs. 124,766.30** |
| 25 | | | ඩී. එස් අයන් වර්ක්ස් | ග්‍රයින්ඩරය දිනකට කුලියට ගැනීම හා හිල්ටි කටුවක් මිලදී ගැනීම | **Rs. 760.00** |
| 26 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | **Rs. 358,850.00** |
| 27 | | | සියනෑ බිල්ඩින් මෙටිරියල් සෙන්ටර් | පුස්ථකාලය ඉදිරිපිට කුඩා ගේට්ටුවට ඉබියතුරු මිලදී ගැනීම | **Rs. 3,250.00** |
| 28 | 2022.07.25 | | විගණකාධිපති | 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම වෙනුවෙන් විගණන ගාස්තු ගෙවීම | **Rs. 41,100.00** |
| 29 | | | ජයසිරි ප්‍රින්ටර්ස් | උහන ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය බිල්පොත් මුද්‍රනය කිරීම | **Rs. 125,795.00** |
| 30 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | 5A ටෝනර් එකක් මිලදී ගැනීම | **Rs. 5,000.00** |
| 31 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | Dog belt 200 මිලදී ගැනීම | **Rs. 3,800.00** |
| 32 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | 5A ටෝනර් 01 මිලදී ගැනීම | **Rs. 5,000.00** |
| 33 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | 30-A Toner -01, 85-A Toner 03 මිලදී ගැනීම | **Rs. 21,450.00** |
| 34 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | IQ 2090 Risbon 01 මිලදී ගැනීම (වැටුප් ප්‍රින්ටරය | **Rs. 4,950.00** |
| 35 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | සුනඛ එන්නත් කටු මිලදී ගැනීම | **Rs. 3,250.00** |
| 36 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | සුනඛ එන්නත් කටු මිලදී ගැනීම | **Rs. 4,875.00** |
| 37 | | | පුබුදු එන්ටර්ප්‍රයිසස් | සුනඛ එන්නත් කටු මිලදී ගැනීම | **Rs. 4,875.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| එකතුව | | | | | **Rs. 990,954.51** |
| | | | | | |
| 38 | | වාහන | ආසිරි ඔටෝ සර්විස් | **PE 8373** රථය සේවා කිරීමේ ගාස්තු | **Rs. 21,965.00** |
| 39 | | | දමිත් ලංකා ටයර් හවුස් | **ZB-0351** කම්පැක්ටර් රථයට ටියුබ් 1 කොලර් 01 මිලදී ගැනීම | **Rs. 6,500.00** |
| 40 | | | ආසිරි ඔටෝ සර්විස් | **ZB-0351 0351** කම්පැක්ටර් රථයට වාර සේවා කිරීමේ ගාස්තු | **Rs. 45,065.00** |
| 41 | | | ආසිරි ඔටෝ සර්විස් | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය වාර සේවා කිරීම සඳහා ලබාගත් ඔයිල් පිල්ටරය ස දහා මුදල් ගෙවීම | **Rs. 7,000.00** |
| 42 | | | දමිත් ලංකා ටයර් හවුස් | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ටයර් දෙක මාරු කිරීම හා අලුත් ටයර් ටියුබ් සවි කිරීම | **Rs. 2,000.00** |
| 43 | | | D.M. දිලාන් තනුජ | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අමතර කොටස් කොළඹ සිට අම්පාර දක්වා ප්‍රවාහනය කිරීමට ගෙවූ මුදල් ප්‍රතිපූර්ණය | **Rs. 2,600.00** |
| 44 | | | ආසිරි ඔටෝ සර්විස් | **RB-1521** ට්‍රැක්ටරය වාර සේවා කිරීම සඳහා පිල්ටර් ලබාගැනීම | **Rs. 2,800.00** |
| 45 | | | කේ කේ සුසන්ත | බැකෝ ලෝඩරයේ ජැක් සීල් කිට් එක අලුතින් දැමීම | **Rs. 6,000.00** |
| 46 | | | කේ කේ සුසන්ත | බැකෝ ලෝඩරයේ ආම් ජැක් එක අලත්වැඩියා කිරීම | **Rs. 6,400.00** |
| 47 | | | කේ කේ සුසන්ත | බැකෝ ලෝඩරයේ නව හෝස් එකක් දැමීම | **Rs. 5,900.00** |
| 48 | | | වීරසිරි මෝටර්ස් | **TL- 9398** යතුරු පැදිය සඳහා අමතර කොටස් මිලට ගැනීම | **Rs. 1,115.00** |
| 49 | | | වීරසිරි මෝටර්ස් | **204-4895** ත්‍රීරෝද රථයට අමතර කොටස් මිලට ගැනීම | **Rs. 3,560.00** |
| 50 | | | එච් ඒ එටෝ සර්විස් | **LL-7065** ටිපර් රථයේ ඇතුලත පිටත සෝදා ග්‍රීස් ගැසීම | **Rs. 6,120.00** |
| 51 | | | යූ.ජී චමින්ද අශෝක | **LL-7065** ටිපර් රථයේ අලත්වැඩියා කිරීමට අමතර කොටස් මිලට ගැනීම | **Rs. 3,225.00** |
| 52 | | | ඩී.එම්.ටී.කේ දසනායක | **UL-2977** යතුරු පැදියේ දුම් වාර්තාව හා ආදායම් බලපත්‍රය ලබාගැනීම සඳහා දුන් මුදල ප්‍රතිපූර්ණය | **Rs. 1,160.00** |
| 53 | | | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | **UL-2977** යතුරු පැදියේ **2022.04.28-2023.04.27** දක්වා රක්ෂණ සහතිකය ලබා ගැනීම | **Rs. 4,464.98** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 54 | | | එච් ජ් එටෝ සර්විස් | 252-6471 කැබ් රථය සෝදා ග්‍රීස් ගැසීමට | Rs. 3,985.00 |
ගෙනියලා තිබෙන්නේ කොයි මට්ටමකට දැයි ඔබ සියලු දෙනාම දන්නා බවත් ප්‍රකාශ කරන ලදී. බිම් මට්ටමේ නායකයන් ලෙස අපත් මේ රට ගොඩ නැගීමට යම් ක්‍රමවේදයක් සැදිය යුතු බව ප්‍රකාශ කරන ලදී. නමුත් ජනතා විමුක්ති පෙරමුණ 1971 හා 1988, 1989 කළ ආකාරයට ගිය මාසේ නව වනදා එක පැය භාගයක් යන විට ගිණි තැබූ බව ප්‍රකාශ කරන ලදී. එයාලා ප්‍රජාතන්ත්‍රවාදයට පැමිණි ආකාරය එයාලාට දැන් අමතක බවත් කැළෑවල රිංග රිංග අනුන්ගේ බත් මුට්ටි හොරකම් කර කකා හිටපු ජනතා විමුක්ති පෙරමුණ අද ප්‍රජාතන්ත්‍රවාදයට ගත් විට අදත් කරන්නේ මේ රටට විනාශයක් විතරක් බව ප්‍රකාශ කරන ලදී. රට භාරගෙන අග්‍රාමාත්‍ය ධූරය භාරගෙන වැඩ කරන්නට ජනාධිපතිතුමා ආරාධනා කළ බවත් නමුත් එය භාර නොගත් බවත් ප්‍රකාශ කරන ලදී. රනිල් වික්‍රමසිංහ මහතාට වෙන රටවල් වල ගෙවල් නැති බවත් වෙන වෙන තැන්වල ගෙවල් නොමැති බවත් නමුත් එතුමාගේ එකම නිවස ගිණි තැබූ බවත් එයට වග කිව යුත්තේ සිරස මාධ්‍ය ආයතනය හා සමගි ජන බල වේගය බවත් ප්‍රකාශ කරන ලදී. එය රාජකීය විද්‍යාලයේ පුස්තකාලය ලෙස පරිත්‍යාග කර තිබූ නිවසක් බවත් එවැනි උතුම් ස්ථානයක් ගිණි තැබීම පිළිබඳව මේ රටම කම්පාවන සිද්ධියක් බවත් ප්‍රකාශ කරන ලදී. අරගලකරුවන් අරගල කරනවා යැයි පවසමින් අදාළ දරුවන්ට බලන්නට තිබෙන ස්ථාන මුන් විසින් විනාශ කර ඉවර කරන බව පෙන්වා දෙන ලදී. අපිත් අරගලයට සහය දුන් බවත් අරගලය යනු උතුම් දෙයක් බව අපි එදා සිතා සිටි බවත් අරගල කරලා හොඳ පැත්තක් කරාවි යැයි අපි සිතා සිටි බවත් මේ 225 ම හොරු නම් මේ රටේ ව්‍යවස්ථාවට පිටින් යන්නට ඔය අරගලකරුවන්ට නොවෙයි මොන එකෙකුටවත් බැරි බවත් ප්‍රකාශ කරන ලදී. එදා සජිත් ප්‍රේමදාස මහතාට අග්‍රාමාත්‍යකම භාර ගන්න යැයි පැවසූ විට එය භාර ගන්න බැරි බව පැවසූ ඔහු අද ජනාධිපතිකම ඉල්ලා සිටින බවද පෙන්වා දෙන ලදී. නමුත් එදා ඔහුට කළ හැකි දේ කර තිබුණා නම් අද මේ රට කොතනද තිබෙන්නේ යැයි විමසන ලදී. තෙල් නැව් ටික පැමිණ මහ මුහුදේ බවත් අද පොහොර නැතුව ජනතාව මේ තත්ත්වයට පත් කර ජනතාව හිගා නොකා හිඟා කන්නට පත් වී සිටින මේ මොහොතේ රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍යවරයා බවට පත්වූ විට මේ රජය කැබිනට් අනුමැතිය අරගෙන පොහොර නැවක් ලංකාවට පැමිණ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ගොවියන් කොපමණ සතුටින් සිටිනවාද යන්නත් නමුත් එය බෙදා ගන්නා බැරිව සිටින බවත් කාලකන්නි අරගලයක් පටන් අරන් තිබෙන බවත් එම අරගලයේ හොඳ අයත් සිටින බවත් මම එම පිරිසට දොස් නොපවසන බවත් ප්‍රකාශ කරන ලදී. අරගලය සද්භාවයෙන් කරන පිරිසකුත් සිටින බවද පෙන්වා දෙන ලදී. නමුත් අද වන විට ජනතා විමුක්ති පෙරමුණ රැලියක් ආවරණය කරන්නට ගොස් යුධ හමුදා සෙපළෙක් මිය ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් අද අපි එකට ඉන්නේ අද අපි හිටගෙන ඉන්නේ අද මහපාරේ බය නැතුව යන්නේ ඒ ආදරණීය රණවිරුවන්ට පින් සිදුවන්නට බවත් ප්‍රකාශ කරන ලදී. ඒ විරෝධාර රණවිරුවන්ට අරගල භූමියේ මොනවාද කරන්නේ කාලකන්නින්ට වගේ ගහලා බැනලා කරන්න තියෙන අවලාද අපහාස සියල්ල කළ බවත් ඔවුන්ට පෙළපාලි යන්න අරගල කරන්න නිදහස් කරලා දුන්නේ රණවිරුවන් බව ඒ පුද්ගලයන්ට අමතක වූ බව ප්‍රකාශ කරන ලදී. එය බොහොම කණගාටුදායක සිද්ධියක් බව ප්‍රකාශ කරන ලදී. එමනිසා අපට කියන්න කෙනෙක් නොමැති බවත් අපට ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීවරයෙක් පමණක් සිටින බවත් එතුමා සිටියා නම් එතුමාට කතා කරන්නේ කන් දෙකේ ඇඟිලි ගසා ගැනීමට යැයි ප්‍රකාශ කරන ලදී. එසේම රනිල් වික්‍රමසිංහ මහතාට බැන බැන යන බවත් එක්සත් ජාතික පක්ෂයට පින් සිදුවන්නට කාන්තා මන්ත්‍රිනියන් 07 දෙනෙක් මේ සභාවේ වාඩිවී සිටින්නේ යැයි ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීකම් ලැබිලා තිබෙන්නේ එතුමාට පින් සිදුවන්නට බවත් නමුත් ඒක අමතක වන අයත් මෙහි සිටින බවත් ප්‍රකාශ කරන ලදී. එසේම මේ සියලුම කාන්තා නියෝජනය ගෙන එන්නට අනුමැතිය ගත්තේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා බව ප්‍රකාශ කරන ලදී. එසේ නොවුනානම් පාර්ලිමේන්තුවේවත් මේ සභාවේවත් කාන්තා නියෝජනයක් නොමැති බව පෙන්වා දෙන ලදී. එමනිසා අප ඒවා අමතක නොකළ යුතු බවත් එතුමාගේ වැරදි තිබෙන්න පුළුවන් බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් ගොස් අරගල කරන්නට මේ රට අල්ලන්නට පුළුවන් දැයි විමසන ලදී. අපි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට හිස නැමිය යුතු බවත් පෙන්වා දෙන ලදී. මටනම් මේ දේශපාලනය අප්පිරිය බවත් එපා වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. හමුදාවේ හා පොලිසියේ නිලධාරීන් දිවුරුම් දෙන විට ව්‍යවස්ථාවට අනුව බැඳී සිටින බවත් ඔවුන්ට පවසන අවලාද ඇසූ විට කළකිරෙන බවත් ප්‍රකාශ කරන ලදී. හැබැයි අරගලකරුවන් කියන්නේ අපි යනකන් තොපි බලා ගෙන හිටපියව් කියාද යැයි විමසන ලදී. අද මේ රටේ අපේ සම්පත් කොපමණ ප්‍රමාණයක් කාලකන්නි විසින් නැති කර තිබෙනවාදැයි ප්‍රකාශ කරන ලදී. අද රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති වී තිබෙන බවත් අපි මොනවා කිවුවත් රටේ විධායක ජනාධිපති ගෝඨාභය රජපක්ෂ බවත් එතුමා රටේ නායකයා සේනාධි නායකවරයා බවත් ඔය කියන ජනාධිපති

මන්දිරයේ එතුමා පමණක් සිටියා දැයි විමසන ලදී. මේ ඉතිහාසගත වන ජනාධිපති මන්දිරයක් බවත් එතුමාට රාජතාන්ත්‍රික හමුවීම් තිබෙන බවත් මේ අරගලකරුවන් ජනාධිපති මැදුර පිළිබඳ තොරතුරු මුළු ලෝකයටම දීලා අවසන් බවත් ආරක්ෂාවට තර්ජනයක් වී ඉවර බවත් ප්‍රකාශ කරන ලදී. මේ රටට කරන විනාශයට ඔවුන් වගකිව යුතු බවත් ප්‍රකාශ කරන ලදී. අද අරගලය මෙහෙය වන්නේ දේශපාලන අතකොලු බවත් එයට මාධ්‍ය සම්පූර්ණයෙන් වගකිව යුතු බවත් අපේ මාධ්‍ය සහෝදරයන්ට කියන්නේ මේක සමබර කළ යුතු බවයි. වෙනසක් ඕනි නම් වෙනසක් ඕන ආකාරය ව්‍යවස්ථාවේ තිබෙන බවත් ව්‍යවස්ථාවට පිටින් ගොස් වෙනසක් කිරීමට නොහැකි බවත් පෙන්වා දෙන ලදී. එය දැන දැනත් රට අරාජික කරන්නට මිසක බලයට තිබෙන තන්හාවට කැදරකමට මිසක බව පෙන්වා දෙන ලදී. ඔය පක්ෂ දෙකෙන් එකක්වත් ජනතාව ගැන නොසිතන බවත් ජනතාව ගැන සිතනවානම් එදා රටේ වගකීම කොන්ද කෙලින් තියන් භාරගන්න තිබුණා යැයි ප්‍රකාශ කරන ලදී. මේ රටේ ජනතාව දුක්ඛිත තත්ත්වයෙන් ගොඩ දමන්නට තිබුණා යැයි මාගේ හැඟීම බව පැහැදිළි කරන ලදී. අද මම සියළුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් ඉල්ලා සිටින්නේ අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටිය යුතු බවයි. අපි පක්ෂයක් නැවතුව ස්වාධීන විය යුතු බවත් මේ අරගලය බොහෝම සුජාත ආකාරයට ගිය බවත් නිර්පාක්ෂික ආකාරයට ගිය බවත් නමුත් දැන් දේශපාලනඥයින්ගේ අතකොළුවක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. දැන් අන්තරේ කියන්නේ මොකද්ද කියලා දන්නා බවත් අන්තරේ කාගේ එකක්ද යන්න අප දන්නා බවත් එයාලා කියන ආකාරයට අගමැති එපා කියන විට යන්න ඕන බවත් ජනාධිපති එපා කියන විට යන්න ඕන බවත් ප්‍රකාශ කරන ලදී. අරලියගහ මන්දිරය වටලා ඒවායේ තිබෙන දේ විනාශ කරන බවත් මේවා ගොඩනගන්නේ කෙසේදැයි විමසන ලදී. මේ රටේ බලය අල්ලන්න තිබෙන ආශාව බල ලෝභීත්වය නිසා මේවා කරන බව පෙන්වා දෙන ලදී. මේ ජනතාව ගැන හිතන්නේ නැති පක්ෂ දෙකක උන් මේ සියල්ල කරන බව ප්‍රකාශ කරන ලදී. මේ දේශපාලනය නිසා මම බොහෝම වේදනාවෙන් සිටින බවත් අපි අද හිටියට හෙට යන්නට වේවිද නොදන්නා බවත් එය පක්ෂයක් නොවන බවත් මම ඕනෑම වේලාවක ජනතා මතයට හිස නමා යන්න සූදානම් බවත් මේ රටේ මිනි කීයක් මරුනාද එසේ  මිනී මරා බලයට එන්න සූදානම් වන්නට එපා යැයි ජනතා විමුක්ති පෙරමුණෙන් හා සමඟි ජන බල වේගයට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන බව පැහැදිළි කරන ලදී. එමනිසා මේ රටේ ජනතාව ගැන සිතා ගොවි ජනතාව ගැන සිතා ඒ පිළිබඳ හොඳ වැඩපිළිවෙලක් අප සියලු දෙනා එකතුවී සිදු කරමු යැයි ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් ප.ව.1.15 ට ගරු සභාපතිතුමා විසින් ගරු උපසභාපතිතුමාට මූලාසනය භාර දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී කේ.වී.ජී. නයනා කුමුදුනී මිය.**

පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාගේ කතාවේදී ඔහු යම් කාරණාවක් මතුකල බවත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිසා ලැබුණු මන්ත්‍රී ධූර 07 න් සමහරුන්ට ඒ මන්ත්‍රී ධූර ගත්තේ කොහොමද කියා අමතක බව ඔහු විසින් පැවසු බවත් එමනිසා මම සිතනවා එම ප්‍රකාශය මම අරඹයා ප්‍රකාශ කරන ලද ප්‍රකාශයක් බව. එමනිසා එයට යම් පිළිතුරක් ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අධ්‍යාපන අමාත්‍ය ධූර දරමින් මේ රටට යම් සේවයක් සිදු කළ බවත් ඒ අතීතය පිළිබඳව අපේ කිසිදු තර්කයක් නොමැති බවත් එතුමා අධ්‍යාපනය සම්බන්ධව ගත් තීන්දු තීරණ සුගතිදායි වැඩපිළිවෙලවල් සම්බන්ධව ඔහු අනාගතය දැක වැඩ කරපු නායකයෙක් බව ඔහුගේ හැසිරීමෙන් හැඟෙන බව ප්‍රකාශ කරන ලදී. නමුත් මේ රටේ මීට මාස කීපයකට කලින් මා මේ සභා ගර්භයේදී පවසා සිටියේ මේ පවතින ආණ්ඩුව මේ ආකාරයට ගියොත් වසර 40 ක කාලයකදී මම දුටු නිර්ලජ්ජිතම ආණ්ඩව බවයි. අරගල පටන් ගන්න මාස කීපයකට උඩදී එම ප්‍රකාශය කළ බවත් ඒ අවස්ථාවේදී එම කාරණය සම්බන්ධව උදහස් වුන බොහෝ මන්ත්‍රීවරුන් එම කාරණාව ඉල්ලා අස් කරගන්නා ලෙස ප්‍රකාශ කළ බවත් නමුත් මම එය ඉල්ලා අස් කරගන්නට අකමැති වූ බවත් මට දැන් අවුරුදු 40 ක් වන බවත් මාගේ වසර 40 ක කාලය තුළ මට යම් දැනීමක් තිබෙන කාලයක් තුළ බිහිවුණු නිර්ලජ්ජිත ආණ්ඩුව ලෙස මම එදා මතු කළ බව ප්‍රකාශ කරන ලදී. එම කාරණය අද මුළු රටම පවසා සිටින බව පෙන්වා දෙන ලදී. ගෝඨාභය රාජපක්ෂ මේ රටේ ජනාධිපති කරන්නේ මේ රටේ යම් වෙනසක් සිදුවේවි නීතියේ ආධිපත්‍ය රකීවී යැයි අපේක්ෂාවෙන් සිටි බහුතරයක් මා එදා කියූ කාරණාව සත්‍යයක් බව අද පවසා සිටින බවත් අද දින පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා පවසා සිටියේ අරගලයේ ප්‍රතිඵලයක්

ලෙස එවකට සිටි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා කරලියෙන් බැස පලා ගිය බවත් ඔහුගේ ජීවිත ආරක්ෂාව තකා සැඟවී සිටි බවත් ඒ අවස්ථාවේදී මේ රටේ අග්‍රාමාත්‍ය ධූරයේ පුරප්පාඩුවක් ඇති වන බව පැහැදිළි කරන ලදී. රටේ තරුණ පරපුර අරගලයක් ක්‍රියාත්මක කළේ නොමැති නම් අදටත් ගෝඨාභය රාජපක්ෂ මහින්ද රාජපක්ෂ සහ ඔවුන්ගේ සහපිරිවර මේ රට තව තවත් වල පල්ලට ඇද දමමින් ඔවුන්ට සිතුමතේ ඔවුන්ගේ සිහින සැබෑ කරගන්නට ජනතාවගේ සිහින දරුවන්ගේ අනාගතය දරුවන්ගේ අධ්‍යාපනය නැති කරන බවත් ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායකට හා සමඟි ජන බල වේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට අගමැති ධූරය භාර ගැනීමට ආරාධනා කළ බවත් නමුත් ලංකාව යනු පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තිබෙන රටක් බැවින් එම රටේ අගමැතිවරයා වන්නේ පාර්ලිමේන්තුවේ පහුතර විශ්වාසය දිනාගත් තැනැත්තා බවත් පෙන්වා දෙන ලදී. එම අවස්ථාවේදී රටේ සංක්‍රාන්ති සමයක් තිබූ බව පෙන්වා දෙන ලදී. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට තුනෙන් දෙකක බලයක් ජනතාව විසින් ලබා දී තිබුණ බැවින් පාර්ලිමේන්තුවේ 225 න් අතිබහුතර බලයක් පොදු ජන පෙරමුණට තිබූ බව පැහැදිළි කරන ලදී. පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා පැවසූ පරිදි අපට ඇතැම් කාරණා අමතක බව රනිල් වික්‍රමසිංහ මැතිතුමා කාන්තා නියෝජනය ගෙන ඒමට ලොකු වෙහෙසක් ගත් බව පැහැදිළි කරන ලදී. මා එයට ගරු කරන බවත් නමුත් ඒ තමන් ලබා ගත් තනතුරු වරප්‍රසාද මත ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යවස්ථා විරෝධී කාරණා වලට ඇස් කන් පියාගෙන සිටීමට මම සූදානම් නොමැති බව ප්‍රකාශ කරන ලදී. එසේ සිටීමට මට හැකියාවක් නැති බව පෙන්වා දෙන ලදී. මේ අවස්ථාවේ ඩී.එස්. සේනානායක මැතිතුමාට ගරු කරන බහුතරයක් එක්සත් ජාතික පක්ෂය සමඟ ජනමතයට ගරු කරන තැනක මම සිටින බව පෙන්වා දෙන ලදී. එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන්ගේ මතය සමග ජනතාවගේ හඬ සමග මම සිටින බව ප්‍රකාශ කරන ලදී.මේ අවස්ථාවේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමාව අනුමත නොකරන බව පෙන්වා දෙන ලදී.මේ අවස්ථාවේ මාගේ මතය මේ ආකාරයෙන් ප්‍රකාශ කරන බවත් එක්සත් ජාතික පක්ෂය වුනත් හරි දේට හරි කියන්නත් වැරදි දේට වැරදි කියන්නත් මා පසුබට නොවන බව පැහැදිලි කරන ලදී.මේ අවස්ථාව පක්ෂ වශයෙන් බෙදෙන අවස්ථාවක් නොවන බවත් මාගේ මතය මා මේ ආකාරයෙන් ඉදිරිපත් කරන බවත් පෙන්වා දෙන ලදී.මා යම් දේශපාලන පක්ෂයක් නියෝජනය කරනවාකම් මාගේ මතය දේශපාලන නායකතුමාගේ මතයම විය යුතු යැයි කවුරුන් හෝ ප්‍රකාශ කරනවා නම් මම අද මේ මන්ත්‍රීධූරයෙන් බැස යන බවද පැහැදිලි කරන ලදී.නායකතුමා කියන ආකාරයට ඉර පෙන්නා හඳ යැයි කිවූ විට පිළිතන්නට මාගේ සූදානමක් නැති බවත් ඕනෑම අවස්ථාවක මේ මන්ත්‍රීධූරය අතහැර යාමට වුවත් සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු උපසභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

අපට ප්‍රා. සභාවට හෝ පලාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට යාමට අවස්ථාව ලැබෙන්නේ පක්ෂයක් නියෝජනය කර නාම යෝජනා ගත යුතු බවත් නායකයා දෙස බලා නොව නාම යෝජනා ගතයුතු නිසා එසේ ගන්නා බවත් එසේ අරගෙන ප්‍රා.ස. හෝ පලාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට තේරී පත් වූ විට පක්ෂය දෙස බලාගෙන වැඩ කලයුතු නොවන බවත් තමන්ගේ හෘදසාක්ෂියට එකගව වැඩ කලයුතු බවත් පෙන්වා දෙන ලදී.එසේ හෘදසාක්ෂියට එකඟව තමන්ගේ වපසරිය තුළ වැඩ කරානම් මේ රට මෙහෙම තත්වයකට පත් නොවන බවත් පෙන්වා දෙන ලදී.මහජන නියෝජිතයා රාජ්‍ය සේවකයා හැම දෙනාම තමන්ගේ හෘද සාක්ෂියට අනුව වැඩ කරනවානම් මේ රට මාසෙන් දෙකෙන් ගොඩ නැඟීමට හැකි බවද පැහැදිලි කරන ලදී. අළුත් දැක්මට අනුව අපි අරගලය විශ්වාස නොකරන නිසා හෘද සාක්ෂිය විශ්වාස කරන බවත් ගෝඨාභය රාජපක්ෂ මහින්ද රාජපක්ෂ හරියටම කටයුතු කරා යැයි නොපවසන බවත් සමහර දේවල් පමණක් අනුමත කරන බවත් යුද්ධය අවසන් කිරීම අප විසින් අනුමත කරන බවත් ප්‍රකාශ කරන ලදී. යුද්ධය අවසන් කිරීම නිසා අපි එතුමාට ගෞරව කරන බවත් අවුරුදු 74 ක කාල වකවානුවේ සාපයට මේ ආණ්ඩුව විතරක් නතු කර නිර්ලජ්ජිතම ආණ්ඩුව යැයි පවසනවානම් පසුගිය කාල වකවානුවල තිබුණු ආණ්ඩු නිර්ලජ්ජිත නැද්ද යන්න විමන ලදී. ආණ්ඩුවලින් රටට කරපු දේවල් තිබෙන බවත් මහජන මුදලින් හෝ පාරවල් ටික සාදා නිම කර තිබෙන්නේ ආණ්ඩුව විසින් ගත් ප්‍රතිපත්ති නිසා බව පෙන්වා දෙන ලදී. ලංකාව යනු කාගෙන්වත් ආධාර රැගෙන හදන්න ඕන රටක් නොවන බවත් රට ඇතුලෙන්ම රට හැදිය හැකි බවත් පෙන්වා දෙන ලදී. කිසිම කෙනෙක් භාර ගැනීමට ඇකමැති වූ රට රනිල් වික්‍රමසිංහ මැතිතුමා භාර ගත් බවත් ඔය කියන නායකයෝ සිටිනවානම් ආණ්ඩුව වැටුණු වෙලාවේ ආණ්ඩුවක් හදන්නට තිබුණා නේදැයි විමසන ලදී. හැමෝම බලයට කෑදර කමේ තමන්ගේ පක්ෂයේ ආණ්ඩුවක් හදන්නට අර අදින බව පැහැදිළි

කරන ලදී. එසේ තනි පක්ෂයක් ගැන නොව හැමෝම එකතු වී ආණ්ඩුවක් සාදා රට පාලනය කරන්නට තිබුණා නේදැයි විමසන ලදී. කවුරුවත් එසේ ඉදිරිපත් නොවුණු බවත් ප්‍රකාශ කරන ලදී. ඊළඟට අපි ඡන්දය ඉල්ලන එක ගැන නොවෙයි රට හදන ක්‍රමය ගැන සිතිය යුතු බව පෙන්වා දෙන ලදී. එසේ ක්‍රමවේදයක් නැතුව මහජන දේපළ අත්පත් කර ගත්තාට වැඩක් නැති බව ප්‍රකාශ කරන ලදී. පක්ෂ න්‍යාය පත්‍රය හදන්නේ නැතුව රට හදන ක්‍රමයක් ගැන සිතිය යුතු කාලය බවත් ප්‍රකාශ කරන ලදී. පන්සලෙන් වත් කොහෙන්වත් මිනිස්සුන්ගේ මනස හදනවා මා දැක නැති බවත් මිනිසුන්ගේ මනස විකෘති කරන දේවල් පැය 24 ම යන බව පෙන්වා දෙන ලදී. රට ගොඩ නගන ආකාරයක් පෙනෙන තෙක් මානයක නොමැති බවද පෙන්වා දෙන ලදී. බඩු මිළ අහස උසට ගොස් ඇති මොහොතක කාගේවත් වැටුප් වැඩිවීමක් සිදු වී නැති බවත් එමනිසා සියලු දෙනාම එකතුවී හොඳ ක්‍රමවේදයකට යායුතු බව මුලින්ම ගම ගොඩ නගා රට ගොඩනගමු යැයි ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් ප.ව.1.25 ට ගරු උප සභාපතිතුමා විසින් ගරු සභාපතිතුමාට මූලාසනය භාර දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. ජයතිලක මහතා.**

රටේ උද්ගතවී ඇති තත්වය පිළිබඳව පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා හා නයනා මන්ත්‍රීතුමියත් උප සභාපතිතුමත් අදහස් දැක්වූ බවත් වසර 22 යුධ හමුදාවේ සේවය කරපු සොල්දාදුවෙක් ලෙසට අද රටේ ආරක්ෂක අංශවලට ඇතිවෙලා තිබෙන තත්වය පිළිබඳව ඔවුන් මොන තත්වයටද පත්වී තිබෙන්නේ කියන තත්වයපිළිබඳව කතා කිරීම මාගේ යුතුකම බව ප්‍රකාශ කරන ලදී.පසුගිය කාල පරිච්ඡේදය තුල අපේ රටේ ජනතාව ඉතාමත්ම පීඩාවට පත්වීසිටින අවස්ථාවක් බවත් ගෑස් නැතිව විදුලිය නැතිව එසේම තෙල් පෝලිම් වල දවස් ගණන් දුක් විදිමින් මහජනතාව ඉතාමත්ම දුක්ඛිත තත්වයකට පත්වී ඇති බවත් මේ සියල්ලටම වගකිව යුත්තේ මේ ආණ්ඩුව පමණක් නොවන බවත් එක්දහස් නමසිය හැත්තෑගණන්වල සිට පැමිණි සෑම ආණ්ඩුවක්ම මෙයට වගකිවයුතු බවත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගෙන තවම අවුරුදු 02 ක් බවත් එතුමාගේ වසර දෙකක කාල පරිච්ඡේදය තුළ දැවැන්තවම කොරෝනා වසංගතයටත් නොයෙකුත් ප්‍රශ්නවලටත් එතුමාට මුහුණ දීමට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. මෙවැනි හේතු කාරණා නිසා දැවැන්ත අරගලයක් නිර්මාණය වූ බවත් මේ රටේ පාරවල් හැදුව බවත් වරායවල් හැදුව බවත් ගුවන් තොටුපලවල් හැදුව බවත් එවැනි දේවල් කිරීම සඳහා පිටරටින් ණය ලබා ගත් බවත් පැහැදිළි කරන ලදී. සෑම ආණ්ඩුවක්ම පිටරට මුදලින් ණය අරගෙන මේ රට තත්ත්වයකට ගොඩ නැගු බව පෙන්වා දෙන ලදී. මේ රටේ ජනතාවත් මේවායේ කොටස් කාරයින් හැටියට අපි දැකිය යුතු බව පෙන්වා දෙන ලදී. එමනිසා මේ අවස්ථාවේදී අපි බෙදී වෙන්වී කටයුතු නොකර ජාතියක් ලෙස මේ ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ප්‍රශ්නය පිළිබඳ බැලිය යුතු බවත් සියලුම පක්ෂ එකතුවී මේ රට මේ තත්ත්වයෙන් ගොඩනැගීම සඳහා එකතුවිය යුතු අවස්ථාවක් බව පෙන්වා දෙන ලදී. අරගලකරුවන් විසින් ජනතා දේපළ ජනතා මුදල් විනාශ කරමින් පවතින බවත් කුමාර ගුණරත්නම් යනු ඩයස්පෝරාවත් සමඟ සෘජුව සම්බන්දතා තිබෙන පුද්ගලයෙක් බවත් පෙන්වා දෙන ලදී. කුමාර ගුණරත්නම් කියන්නේ මේ රට හදන්න ඉන්න මිනිහෙක් නොවන බවත් මේ රට විනාශ කරන්න ඉන්න මිනිහෙක් බව නිර්භයවම ප්‍රකාශ කරන බවත් පෙන්වා දෙන ලදී. එසේම ජනතා විමුක්ති පෙරමුණ 1988,1989 භීෂණ කාලයේ මේ රටේ තරුණ තරුණියන් හැටදාහකගේ පමණ ජීවිත පූජා කරන්නට සිදු වූ බවත් එම වකවානුවේ යුධ හමුදාවේ සේවය කරන බවත් මාතර දිස්ත්‍රික්කයේ මා රාජකාරි සිදු කළ බවත් පෙන්වා දෙන ලදී. එම වකවානුවේ ජනතා විමුක්ති පෙරමුණ බස් ගිනි තියා, ට්‍රාන්ස්පෝමර් ගිනි තියා දේපළ හානි කර මහමග මිනිසුන් ගිනි තබා මරා දැමුණු ලැබූ බව පෙන්වා දෙන ලදී. අද ඉන්න තරුණ තරුණියන් මේ අතීතය නොදන්නා බවත් එදා හැමදාම මහමග තිබෙන්නේ මිනී කඳන් බවත් ටයර් සෑයවල් මත අමුවෙන් දැවෙන යුගයක් ඒ වකවානුව බවත් පෙන්වා දෙන ලදී. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ තීන්දුවක් අරගෙන මෙය මර්ධනය කළ බව පෙන්වා දෙන ලදී. එමනිසා අදත් අප විසින් පවසා සිටින්නේ මේ අයට නටන්න නොදී මෙයට තීන්දුවක් අරගෙන ආරක්ෂාව වහා තහවුරු කළ යුතු බවයි. යුද්ධයෙන් දහස් ගණන් සොල්දාදුවන් මිය ගොස් එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් රට නිදහස් කර ගත් බවත් 1983 කළු ජූලියේ සිට එල්.ටී.ටී.ඊ. සංවිධානය නිසා සිංහල දෙමළ ජීවිත දහස් ගණන් නැති වූ බවත් අවි ආයුධ රැස් කරමින් වසර 30 ක් එල්.ටී.ටී.ඊ. සංවිධානය දේපළ විනාශ කළ බවත් පෙන්වා දෙන ලදී. එහෙම අතීතයක් තිබුණ අපේ රටේ මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් නිදහස් කර ජීවත්වීමේ අයිතිය අපට ලබා දුන්

බව ප්‍රකාශ කරන ලදී. එම හේතුව නිසා මම අදටත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගරු කරන බව ප්‍රකාශ කරන ලදී. පසුගිය දිනක මා විසින් පවසා සිටියා අම්පාරේ අපට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් අසාධාරණයක් කරන බව. එසේම මහින්ද රාජපක්ෂ මහතා නිසා ගෝඨාභය රාජපක්ෂ මහතා එතනයට පැමිණි බව මා එදා ප්‍රකාශ කළ බවත් මා අදටත් පවසා සිටින්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට නිදහස් කළ බවත් නමුත් පසුගිය දිනක ජනතාව විසින් සිදු කළ අප්‍රසාද ජනක සිද්ධිය නිසා එතුමාට යන්නවූ බවත් එතුමාට යන්න වූයේ එතුමා කළ වැරදි වෙලට නොවන බවත් මේ රටේ කඩකප්පල්කාරීන් එකතුවී එතුමා මේ තත්ත්වයට පත් කළ බව පෙන්වා දෙන ලදී. එමනිසා විශේෂයෙන්ම අද දින මේ සභාවේදී කතා කරන්නේ මේ අම්පාරේ අප ජීවත්වී සිටින්නේ පය ගහලා සිටින්නේ මහින්ද රාජපක්ෂ මහතා නිසා බව ප්‍රකාශ කරන ලදී. එසේම ගෑස් නැතුව දුක්විඳින ජනතාව වෙනුවෙන් පෙනී සිටිය යුතු කාලය දැන් එළඹ ඇති බව පෙන්වා දෙන ලදී. නමුත් දහස් ගණන් ජනතාව පාරවල් වල දුක් විඳින බවත් අපේ රටේ වැඩ කරන පැය ප්‍රමාණය ගත් විට පෝළිම් වල ඉන්න ජනතාව දෙස බැලූ විට අපේ රටේ වැඩ කරන පැය ලක්ෂ ගණනක් අපතේ යන බව පෙන්වා දෙන ලදී. තෙල් පෝළිම් වල ද මේ ආකාරයට දුක් විඳින බවත් නමුත් තෙල් පෝළිම් වල මාපියාවක් වන බවත් මාගේ අවශ්‍යතාවයකට කෙනෙකුගෙන් ඉන්ධන ලීටර 4 ක් ලබා ගත් බවත් රුපියල් එක්දහස් තුන්සිය බැගින් ඒ සඳහා මුදල් ලබා දීමට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. ඉන්ධන පිරවුම්හලෙන් රු. 450.00 න් ඉන්ධණ ලබා ගෙන රු. 1300.00 කට විකුණන බව ප්‍රකාශ කරන ලදී. නමුත් රට හදමු කියා තරුණයින්ට භාර දෙමු කියනවා. නමුත් සොරකම් හැමතැනම තිබෙන බව පෙන්වා දෙන ලදී. සමාජයම විකෘති වී තිබෙන බවත් සමාජයේ හැදියාවක් නොමැති බවත් විනය ගරුක බවක් නොමැති බවත් මෙසේ ගියොත් රට පාලනය කිරීමට නොහැකි වන බවද පෙන්වා දෙන ලදී. එමනිසා ආරක්ෂක අංශ වලට සම්පූර්ණ බලය දිය යුතු බව පෙන්වා දෙන ලදී. කඩාකප්පල්කාරී දේවල් සියල්ලෙන්ම මේ රට නිදහස් කර යුද්ධයෙන් රට නිදහස් කළ ආකාරයට මේ අරගලකරුවන්ගෙන් නිදහස්කර සමථයකට පත් කර යහපත් දේශයක් බවට පරිවර්ථනය කිරීමට හැකියාව තිබෙන බවට පෙන්වා දෙන ලදී. නමුත් අරගලයේ සිටින සියලුදෙනාම නරක යැයි පවසන්නේ නැති බවත් එහි යම්තාක් දුරට සාධාරණයක් තිබෙන බවද ප්‍රකාශ කරන්නට කැමති බව පෙන්වා දෙන ලදී. නමුත් මේ අරගලය ඇතුලට එකතුවී ඇති යම් යම් කණ්ඩායම් අපේ ජාතික වස්තූන් විනාශ කරමින් පවතින බවත් පෙන්වා දෙන ලදී. එමනිසා මේවා රටේ මුදල් මහජනතාවගේ මුදල් බැවින් ඒවා ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙන ලදී. එමනිසා මේ අවස්ථාවේදී මම රණවිරුවෙක් ලෙසටත් ප්‍රාදේශීය සභා නියෝජිතයෙක් ලෙසටත් සියලුම ආරක්ෂක අංශ වලට ශක්තිය ධෛර්ය ලැබෙන්නට ප්‍රාර්ථනා කරන බවත් මේ රට නැවත වරක් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ගොඩනැගීමට හැකිවේවායි පතන බවත් ප්‍රකාශ කරන ලදී. මේ අවස්ථාවේ ජනාධිපතිතුමාගේ වැඩ ආවරණය කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා පත් කර ඇති බවත් කවුරු සතුටු වුනත් කවුරු අසතුටු වුනත් මේ ක්‍රමවේදය බවත් මෙම ක්‍රමවේදය තුළ අප කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. එසේ නොවුන හොත් වල් වැදුනු න්‍යාය පත්‍රයක් තුළ නන්නත්තාර වුණු තත්ත්වයකට මේ රට පත්වන බව පෙන්වා දෙන ලදී. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මාගේ බලවත් ප්‍රසාදය හා ගෞරවය මේ අවස්ථාවේදී පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා.**

පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා අද රටේ පවතින තත්ත්වය පිළිබඳව යම්කිසි ප්‍රකාශයක් කිරීමෙන් අනතුරුවම විවාදාත්මක තත්ත්වය ඇති වූ බවත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා අද හිටියානම් හොඳ යැයි හැඟියන බවත් පාළුගෙයි වළං බිඳිනවා වැනි දෙයක් වේවිදෝයි හැඟෙ න බවත් ප්‍රකාශ කරන ලදී. මා හට හැඟෙන ආකාරයට ප්‍රාදේශීය සභාව තවත් වාරයක් තියේවිද යන්න සැක සහිත බවත් අද අන්තිම සභා වාරය ලෙස සළකා කතාවක් කළොත් හොඳයැයි අදහස් කළ බව ප්‍රකාශ කරන ලදී. අපි කවදාවත් බලාපොරොත්තු නොවුණු ඉතාමත් ඛේද ජනක තත්ත්වයකට ලංකාව පත්වී ඇති බවත් එයට හේතුව ලෙස අරගලකරුවන් සහ විවිධ පක්ෂ නියෝජනය කරන පුද්ගලයින් ඍජුව ඇඟිල්ල දික් කරන්නේ රාජපක්ෂ පවුල නමින් බවත් නමුත් අවුරුදු 70 ක් තිස්සේ මේ රට දෙපැත්තකට දෝලනය වෙමින් ආණ්ඩුකරණය කරගෙන පැමිණි බවත් 1977 එවකට එක්සත් ජාතික පක්ෂ විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ගත් අදූරදර්ශී තීන්දුවක් උඩ මේ රට මේ තත්ත්වයට පත් වූ බවත් පැහැදිළි කරන ලදී. ස්වඋත්සාහයෙන් නැඟී සිටින දේශීය නිෂ්පාදන නැති කරන විවෘත ආර්ථික ක්‍රමය මේ රටට හඳුන්වා දුන් දිනයේ සිට මේ රටට කණකොකා හඬන්නට පටන් ගත් බවත් නමුත් එය සමහරුන්ට අමතක වී ඇති බව පෙන්වා දෙන ලදී. අපි ඒ තුළින් අඩු මුදලට බඩු ගන්නට හුරු වූ බවත් අපි මහන්සි වී එය සාදන්නේ නැති බවත් පෙන්වා දෙන ලදී.

එමනිසා අපි වෙනත් රටවලින් විශේෂයෙන් චීනයෙන් එන සියලුම දේ ගැනීමට පුරුදු වූ බවත් ලංකාවේ නිෂ්පාදනය එයින් අඩාලවූ බවත් පෙන්වා දෙන ලදී. අප රට ඉතාමත් දියුණු තත්ත්වයක තිබූ රටක් බවත් අපේ රටේ බොහෝ දේ නිෂ්පාදනය කළ බවත් උපාලි විජේවර්ධන මහතා සිටින කාලයේ රථ වාහන නිෂ්පාදනය කළ බවත් යුනික් ගුවන් විදුලිය නිෂ්පාදනය කළ බවත් එසේ විශාල පිම්මක් යන්නට පෙරට ගමන් කරන්නට ජේ.ආර්. ජයවර්ධන මහතා විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දී මේ රට නැති හංගස්ථාන කරනු ලැබූ බව ප්‍රකාශ කරන ලදී. එමනිසා රටේ දේශීය ආර්ථිකය සහමුලින්ම කඩා වැටුනු බව පෙන්වා දෙන ලදී. එදා සිට අපේ තිබුණු කර්මාන්ත සියල්ල දවසින් දවස දවසින් දවස වැටුණු බව පැහැදිළි කරන ලදී. අපේ රටේ අය මේ වගේ දේවල් අතහැර වෙනත් රටවලින් භාණ්ඩ ආනයනය කර මුදල් සෙවීමට හුරු වූ බව පැහැදිළි කරන ලදී. මේ රට කඩා වැටෙන්නට ප්‍රධානතම හේතුව වූයේ එය බව පෙන්වා දෙන ලදී. අද වන විට අපේ රටේ තරුණ තරුණියන් එකතුවී අරගලයක් පටන් අරගෙන ඇති බවත් මේ රට ඉතාම හොඳ තැනකට ගෙන ආ යුතු යැයි ඉතාම පරම පවිත්‍ර චේතනාවෙන් එයින් කොටසක් කටයුතු කරන බව පෙන්වා දෙන ලදී. නමුත් එය තුළට රිංගා ගත් නිර්පාක්ෂික කියන ජනතා විමුක්ති පෙරමුණ එසේම එයින් කැඩී ගිය නිවුන් සහෝදරයෙක් වුණු පෙරටු ගාමීන් ඇතුළු සමගි ජන බල වේගය යන අය මේ අරගලය දියාරු කර අරමුණු වෙනස් කර මේ තරුණ තරුණියන් බිල්ලට දෙන ගමන් මේ රට අද මේ වන විට විනාශකාරී අති බිහිසුණු තත්ත්වයකට ඇද දමා ඇති බව ප්‍රකාශ කරන ලදී. ජනතා විමුක්ති පෙරමුණ 1988, 1989 කාලයේ කරපු විනාශ කරපු දේ අප කතා කරන විට තැපැල් කන්තෝරු, ගොවි ජන සේවා මධ්‍යස්ථාන, රබර් කර්මාන්තශාලා ආදී ගිණි තියපු තේ කර්මාන්තශාලා, ට්‍රාන්ස්පෝමර් ගිනි තැබූ බවත් එසේම මේ රටේ දහස් ගණන් විද්වතුන් මරා සංඝයා වහන්සේලා මරා තරුණ තරුණියන් මරා ඔවුන් කරපු දේවල් අපි මතක් කරන විට පරණ දේවල් මතක් කරන්න එපා යැයි අපට පවසා සිටින බවත් අපි එහෙම නැහැ ඒ කාලයේ සිටිය අය තමයි එහෙම කලේ දැන් අපි හොඳයි යැයි පවසන ඔවුන් තවම පෙළපාලියක මුලින්ම ගෙනියන්නේ කාල් මාක්ස් හා ලෙනින් බව පෙන්වා දෙන ලදී. කාල් මාක්ස් 1818 ඉපදී 1883 මිය ගොස් ඇති බවත් ලෙනින් 1870 ඉපදී 1924 මිය ගොස් ඇති බවත් 1988, 1989 ගැන කතා කරන්න එපා යැයි ජනතා විමුක්ති පෙරමුණ පවසන බවත් නමුත් ඔවුන් තවම එක්දහස් අටසිය ගණන්වල විප්ලව කරපු නායකයින්ගේ දේවල් කතා කරන බවත් පෙන්වා දෙන ලදී. එහෙම යුගයක අරගලය යන්න අශුද්ධ මෙහෙයුමක් බව ලෙනින් ප්‍රකාශ කරන බවත් කොල්ලකෑම් මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ යන සියල්ල අරගලය තුළ තිබෙන බව ඔහු පවසා සිටින බවත් එසේම විවිධ මානසික මට්ටම් ඇති පිරිස් සහභාගී වීම නිසා අරගලය අශුද්ධ වන්නේ මේ අවස්ථාවලදීය. එසේම මෙම අරගලය සද්භාවයෙන් සාර්ථක කර ගැනීම සඳහා විශාල තරුණ තරුණියන් පිරිසක් ගිය බවත් පෙන්වා දෙන ලදී. එයාලා සද්භාවයෙන්ම මේ රට මෙහෙම තිබිලා හරි නොයන බව දුටු බවත් අපි පක්ෂ පස්සේ දුවලා තේරුමක් නැහැ. මේ පක්ෂ එකක්වත් වැඩක් නැහැ. අළුත් ක්‍රමයක් හදා ගත යුතු බව එයාලා පැවසූ බව අපිත් එයට ගරු කළ බවත්, පැහැදිලි කරන ලදී. කාගේ හෝ වරදින් අපිත් තවම දුක්විඳින බවත් රාජපක්ෂ පවුලට ලසු කරන්නට පුළුවන් කාරණාවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. අපි මේ මාසයේ හම්බ කරනවා. ඒක වියදම් කරනවා. ලබන මාසයේ නැවත හම්බ කරනවා. නැවත වියදම් කරනවා. වැඩිපුරම ලංකාවේ සිටින්නේ මාසෙන් මාසෙට, මාසෙන් මාසෙට රෝලක් ගහගෙන යන අය බවත් හදිසියේ අපට අසනීප වී ලක්ෂ ගණනක ඔපරේෂන් එකක් කරන්නට සිදුවුව හොත් අපිට කාටහරි ණය වීමට සිදු වන බවත් එදාට අපි ගහගෙන ආපු රෝල ගහන්නට නොහැකි වන බවත් අපි කෙසේ හෝ ණය ගෙවිය යුතු බවත් ලංකාවත් ඒ ආකාරයට ගිය බවත් දීර්ඝ කාලයක් තිස්සේ ණය වීම සහ ණය කිරීම සිදු වූ බවත් කවදාවත් අය වැය හිඟයක් නොමැති වී නැති බවත් ප්‍රකාශ කරන ලදී. අයවැය කවදාවත් සමාන වී නැති බවත් හැමදාම අයවැය හිඟයක් තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. ඩොලර් මිලියන ගණනක හිඟයක් තිබූ බවත් ඒ හිඟය තිබියදී අපි අදහස් නොකරන ව්‍යවසනයක් එම රටට සිදුවුව හොත් අප ඒ ව්‍යවසනයෙන් අන්ත අමාරු තත්ත්වයකට පත්වන බවත් ලංකාවට සිදුවූයේ ඒ දේ බවත් කොරෝනා වගේ විශාල ව්‍යවසනයක් ලංකාවට ඇතිවේවි යැයි අපි බලාපොරොත්තු නොවනු බවත් කොරෝනා හැදෙන විට එක එක්කෙනා රැගෙන ගොස් බෙහෙත් ලබා දුන් බවත් කොපමණ වියදම් යනවාදැයි කවුරුවත් නොසිතූ බවත් කොළඹ ප්‍රදේශයේ කොරෝනා ලෙඩෙක් හැඳුනාම මඩකලපුවට රැගෙන පැමිණි බවත් එසේ ඔවුන්ට ප්‍රතිකාර කරනවා සේම රු. 10,000.00 ක බඩු මල්ලක් ලබා දුන් බවත් පෙන්වා දෙන ලදී. එවැනි අවස්ථාවක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පවසා සිටියේ මේ රටේ ජනතාව මා පළමුවෙන්ම බේරාගත යුතු බවයි. එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ එදා රට වැහුවාම රට වැටෙන බව දන්නා නිසා රට වසන්න ඔවුන් ක්‍රියාකළ බවත් ඔවුන්ට අවශ්‍ය මේ රට වැට්ටවීම බවත් මේ රට විශාලාවක් වනවා මිනී

කනත්තක් වනවායැයි ඔවුන් එදා පවසා සිටිය බවත් ප්‍රකාශ කරන ලදී. මෙවැනි කතා පවසා කොහොම හරි රට වැස්ස වූ බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් එදා ගෝඨාභය රාජපක්ෂ මහතා පවසා සිටියේ මේ රට අකමැත්තෙන් වසන බවයි. අප හිතුවට වඩා ඉක්මනින් රට කඩා වැටුණු බවත් රටේ තෙල් ටික නැති වූ බවත් ගෑස් නැතිවූ බවත් එසේම විශාල ප්‍රශ්න රාශියක් ඇති වූ බවත් පෙන්වා දෙන ලදී. මේ අතර වාරයේදී තරුණ තරුණියන් එක්වී අරගලයක් පටන්ගෙන මේ රට වෙනසක් කරා ගෙන යාමට අවශ්‍ය බව පවසා පෙරට පැමිණි බව ප්‍රකාශ කරන ලදී. ඒ අතරේදී මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා ඉල්ලා අස්වූවාට පසු පළමුවෙන්ම මේ රට භාර ගැනීමට ආරාධනා කරනු ලැබුවේ සමගි ජන බලවේගයේ නායකයාට බවත් දෙවනුව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායකට බවත් පෙන්වා දෙන ලදී. නමුත් ඔවුන් පවසා සිටියේ ජනාධිපතිතුමාත් ඉවත්වී යන ලෙසයි. එයාලාට අවශ්‍ය වී තිබුණේ මේ අද වගේ තත්ත්වයක් ඇති කරන්නට බවත් රට අරාජික කිරීමට බවත් පෙන්වා දෙන ලදී. ව්‍යවස්ථානකූලව රජයක් ඉදිරියට යාමේදී රටේ ජනාධිපති, අගමැති එකවර ඉවත් වුවහොත් මේ රට අයාලේ යාමට පටන් ගන්නා බවත් ඊට පසු මේ රටේ රජ කරන්නේ පාතාල පුද්ගලයන් කුඩුකාරයින් බවත් පෙන්වා දෙන ලදී. එවිට මේ රටේ සිටින ආරක්ෂක හමුදාවන්ට එයට මුහුණ දීමට සිදුවන බවත් එයට බුද්ධිමත් ආකාරයෙන් මුහුණ නොදුන්නොත් මුළු රටම ලේ විලක් වන බවත් පෙන්වා දෙන ලදී. අද ඒ තත්ත්වයට පත්වී ඇති බවත් එක්සත් ජාතික පක්ෂ නායකතුමා තනියෙන් සිටියත් මට මේ රට ගොඩනැගීමට සහයෝගය දේවිය යැයි විශ්වාසයෙන් අග්‍රාමාත්‍ය තනතුර භාර ගත් බව පෙන්වා දෙන ලදී. මේ වන විට මාස 2ක් පමණක් ඉක්ම ගිය බවත් එසේ මාස 2ක යන විට එතුමාටත් යන ලෙස ප්‍රකාශ කරන බවත් පෙන්වා දෙන ලදී. මම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කවදාවත් කඩේ ගිය පුද්ගලයෙකු නොවන බවත් නමුත් මේ රට ගොඩනැගීමට සද්භාවයෙන් ඉදිරිපත් වනවානම් එතුමා කිසිම ලාභ ප්‍රයෝජනයක් බලාපොරොත්තු නොවී කවුරුවත් භාරගන්නේ නැති මොහොතක රට භාරගත්තා නම් එතුමාට එය කරගෙන යාමට ඉඩ දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මාධ්‍යවේදීන් විසින් අනුර කුමාර දිසානායක විසින් විමසා සිටින්නේ ඔබතුමාට මේ රට භාර අරගෙන කරන්නට හැකිදැයි හා රට යථා තත්ත්වයට පත් කරන්නට කොච්චර කාලයක් යනවාදැයි බවයි. එතුමා පවසන්නේ තෙල් ටික ගෑස් ටික දෙන්නට අඩුම තරමේ මාස 6 ක් වත් යන බවයි. එසේ නම් ඔච්චර වැඩ්ඩෙක් කියන ඔහුට මාස හයක් යනවානම් රනිල් වික්‍රමසිංහ මහතාට මාස දෙකෙන් කරන්නට බැරි බව ඔවුන් තේරුම් ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මේ දෙස බැලූ විට තනිකරම තිබෙන්නේ ඊර්ෂ්‍යාව කුහකත්වය හා බලලෝභීත්වය බව පෙන්වා දෙන ලදී. මෙතන ඔවුන්ට රට හදන්නට අවශ්‍යතාවයක් නැති බවත් ජනතා විමුක්ති පෙරමුණ රට හදන්නට අවශ්‍යතාවයක් තිබුණානම් එදා අපි රට භාර ගන්නවායැයි පවසන්නට තිබූ බවත් අප කියන ආකාරයට අපේ යෝජනා සමඟ රට ඉදිරියට ගෙනයන්න ඕන යැයි පවසා සිටින්නට තිබුණා යැයි ප්‍රකාශ කරන ලදී. එයාලාට ඕන, අපි තමයි මේක කළේ අපට ලකුණු ලබා දිය යුතුයි ඊළඟ ඡන්දයේදී අපිත් පත් කර එවන්න යැයි ප්‍රකාශ කරන ලදී. නමුත් ජනතා විමුක්ති පෙරමුණට ඕන ආකාරයට මෙය සිදු නොවන බවත් ශුද්ධත්වයෙන් පැමිණි අරගලකරුවන්, මැදදී පැන මෙය විනාශ කරන්න හදන අරගලකරුවන් හඳුනාගෙන ඔවුන්ට ප්‍රහාර දියත් කරමින් සිටින බව පෙන්වා දෙන ලදී. එය එසේ සිදුවිය යුතු බවත් එසේ නොවුනහොත් මේ රට කොහේ කොතනින් නතරවේවිදැයි අපට කියන්නට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. අනුර කුමාර දිසානායකලා මේ රටට කරපු දේවල් වෙන දේශපාලනඥයින් විසින් හෙළි නොකිරීම නිසා හිතට දුක බවත් හැමදාම බොරුවට ෆයිල් මිටියක් අරගෙන කවුරුන් හෝ භය කරන බවත් පෙන්වා දෙන ලදී. ෆයිල් තිබේනම් නඩු දමා වරදකාරයින් පිටුවහල් කළත් ප්‍රශ්නයක් නොමැති බව පෙන්වා දෙන ලදී. නමුත් හැමදාම බොරුවට චෝදනා කිරීමට ඕන නිසා හිඟන්නාගේ තුවාලය වගේ හොඳ වෙන්නට නොදෙන බවත් පෙන්වා දෙන ලදී. අනුර කුමාරලාට බඳු වංචා තිබෙන බවත් ඒවා ගැනත් කතා නොකරන බවත් මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වාහනයක් දෙන බවත් එම වාහන සියල්ල විකුණා ඇති බවත් පෙන්වා දෙන ලදී. අදටත් මේ වන විට රාජ්‍ය දේපළ අයුතු ලෙස පරිහරණය කරන මාදිවෙලින් මන්ත්‍රීවරුන්ට නිවාස ලබා දෙන බවත් විජිත හේරත් මන්ත්‍රීතුමාට ලැබුණු නිවාස ලාල් කාන්ත මහතාට ලබා දී ඇති බවත් අවුරුදු 23 ක් තිස්සේ එම නිවසේ සිටින බව පෙන්වා දෙන ලදී. අනුර කුමාරගේ නිවසත් ඒ අකාරයට වෙන කෙනෙකුට දීලා තිබෙන බව පෙන්වා දෙන ලදී. මෙය ජනතා මුදල් අයථා ලෙස පරිහරණය කිරීමක් නොවේද යන්න විමසන ලදී. මීළඟට පත්වෙන ආණ්ඩුව පළමුවෙන්ම කළයුත්තේ හොරු කියන මිනිසුන්ට නඩු දමා මාස 06 ක් ඇතුළත නඩු අසා දඬුවම් දිය යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේ වැරදි නැති මිනිසුන් වැරදි නැහැ කියා ජනතාවට ප්‍රකාශ කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. නයනා මන්ත්‍රීතුමිය පවසා සිටියේ මහින්ද රාජපක්ෂ මහතා මිනිසුන්ට බයේ පැනලා ගියා කියලා

බවත් නමුත් මහින්ද රාජපක්ෂ එසේ මිනිසුන්ට බය මිනිසෙකු නොවන බවද පෙන්වා දෙන ලදී. ඇමරිකාවෙන් පැමිණ යුද්ධය නතර කරන්න කියා දණගස්සවන්න හැදූ බවත් තවත් රටවලින් යුද්ධය නතර කරන ලෙස බලපෑම් කර බවත් නමුත් මහින්ද රාජපක්ෂ ඒවාට බය නොවුණු බවත් පෙන්වා දෙන ලදී. නමුත් ඕනම මිනිසෙකුට ඔරොත්තු නොදෙන ජනසංඛ්‍යාවක් පැමිණ තමන්ගේ නිවස වැටලීම සිදු කර ප්‍රහාර එල්ල කරනවානම් තමන්ට මොලය තිබෙනවානම් තමන් පසුබැසිය යුතු බවත් එයට බියගුලුකම යැයි නොකියන බවත් එය පසුබැසීම බවත් එය ඕනෑම ආරක්ෂක හමුදාවටත් තිබෙන බවත් පෙන්වා දෙන ලදී. මහින්ද රාජපක්ෂ වැනි රට බේරාගත් නායකයෙකුට චෝදනා කිරීම දැඩි ලෙස පිළිකුලෙන් යුතුව හෙළා දකින බවත් පෙන්වා දෙන ලදී. සතුටින් සහයෝගයෙන් කටයුතු කළ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනාට සුභ පතන බවත් අපි දේශපාලනයෙන් නික්ම නොයා ඉමු යැයි ප්‍රකාශ කරන ලදී. පොහොට්ටුව කියලා පක්ෂයක් නැවත ලංකාවේ නොමැති වේවි යැයි සමහරු සිතා සිටින බවත් එහෙම දෙයක් කවදාවත් සිදු නොවන බවත් පෙන්වා දෙන ලදී. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා මරා අලු කර අයත් සමඟ අනුර කුමාරලාට ඩීල් දාන්න පුළුවන්නම් අපට අනාවැකි පල කළ නොහැකි බවත් අද වන දේ හෙට වෙනස් විදිහකට වෙනස් වෙන්නට පුළුවන් බවත් සමහර විට නයනා මන්ත්‍රීතුමිය අපේ පැත්තේ වාඩි වී සිටින්නට පුළුවන් බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

අපි කවුරුත් මැරෙන මිනිස්සු බවත් අපි කවුරුත් කතා කලේ දේශපාලනය බවත් අපේ දෙමාපියන්ගේ සිට සියළුම දෙනා කුමන හෝ දේශපාලන පක්ෂයක සාමාජිකයන් බවත් ඒවා අපි ඉදිරියට දෝලනය කර ගෙන පැමිණෙන බවත් පෙන්වා දෙන ලදී. නයනා මන්ත්‍රීතුමිය ගත් විට එතුමියගේ පියා මේ සභාවේ හිටපු මන්ත්‍රීවරයකු බව පෙන්වා දෙන ලදී. අපි දේශපාලනය කරන විට අපි අපේ නායකයන් වෙනුවෙන් කඩේ යන බවත් නමුත් අපි කාට කඩේ ගියත් කවුරු කඩේ ගියත් අද මේ රට පත්වෙලා තිබෙන තත්වය පිලිබඳ රටේ මිනිස්සු විදින වද වේදනා පිලිබඳ අපි කාටවත් සතුටුවන්නට පුළුවන් මට්ටමක නැති බව ඒ සියලු දෙනාගේම හෘද සාක්ෂිය දන්නා බවත් පෙන්වා දෙන ලදී. නමුත් 1977 මැතිවරණයේ අපේ ගෙවල් දොරවල් දේපළ සියලු දේ විනාශ වූ බවත් එවකට බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයින් විසින් එසේ සියලු දේ විනාශ කළ බව පෙන්වා දෙන ලදී. එසේ සියලු දේ විනාශ වී අවුරුදු 17 ක් අන්ත අසරණ තත්ත්වයකට පත්වී සිටි බවත් අවුරුදු 17 ක් එක්සත් ජාතික පක්ෂය තාඩන පීඩනවලට ලක්වී සිටි බවත් බොහෝම අමාරුවෙන් සිටි කාල වකවානුවක් බව පැහැදිලි වේ. මේ අවස්ථාවේදී චන්ද්‍රිකා බණ්ඩාරණායක මැතිණිය බොහෝම ආදරයෙන් මතක් කරන බවත් එයට හේතුව දකුණු පළාත් සභාව ජයග්‍රහණය කර මේ බලවේගය ගොඩ නැගූ බවත් යම් තැනකට ලංකාව ගෙන ඇවිත් පාලනය කළ බවත් නැවත අභ්‍යන්තර කුමන්ත්‍රණයක් හේතුවෙන් වසර 02 ක් ආණ්ඩු බලය විපක්ෂයට ගිය බවත් නමුත් එය හරියාකාරව කරගෙන යාමට නොහැකි වී නැවත බලයට පැමිණි බවත් මේ ආකාරයට 2005 වර්ෂය වන තුරු වෙනස් වීම්වලට ලක් වෙවී පාලනය කරගෙන පැමිණි බවත් ඒ කාලයේ අපි විවෘත ආර්ථිකයට එකඟ නොවුනු බවත් පෙන්වා දෙන ලදී. එවිට ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකට වැඩ කළ බවත් අදහස් එකසමානව තිබූ බවත් එසේ පැමිණ 2005 මහින්ද රාජපක්ෂ මහතා බොහෝම සුළු ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කළ බවත් පෙන්වා දෙන ලදී. ප්‍රාදේශීය සභා ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂයෙන් තොර ආණ්ඩුවක් නොතිබූ බවත් නමුත් 2006 වර්ෂයේ ප්‍රථම වරට අප විසින් ප්‍රාදේශීය සභා බලය තහවුරු කරගත් බවත් පැහැදිළි කරන ලදී. 2006 වර්ෂයේ සිට මේ වන විට අවුරුදු 16 කට ආසන්න කාලයක් අප මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පාලනය කර තිබෙන බවත් පෙන්වා දෙන ලදී. එවිට හෘද සාක්ෂිය ගැන සිතනවානම් අප අතින් සිදුවුණු කාර්ය භාර්ය හා සිදු නොවුනු කාර්ය භාර්ය කොපමණදැයි ඊට සාපේක්ෂව අවුරුදු 16 කට එහා සිදු වුණු කාර්ය භාර්ය කොපමණදැයි ඒ වකවානුවේ සිටි අයත් මේ ප්‍රදේශයේ ජනතාවත් දන්නා බව පැහැදිළි කරන ලදී. නමුත් අපෙනුත් අඩුපාඩු සිදු නොවුනාම නොවන බවත් නමුත් අපි කළ හැකිදේ උපරිමයෙන් කළා යැයි විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදී. 2015 ජනාධිපතිතුමා වෙනස් වූවාට පසු වෙනස්ම ප්‍රවණතාවයක් පැමිණි බවත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙන් පසු නැවත මහින්ද රාජපක්ෂ මැතිතුමා මහින්ද සුළඟ ඉතාම උද්යෝගයෙන් ජනතාව එක් රැස් කර විශාල ජන ගඟක් එම පක්ෂය වටා ගොඩනැගෙමින් 2018 වැඩිම ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහණය කළ බවත් එයට අප සියලු දෙනා දායක වූ බවත් ජනතා විමුක්ති පෙරමුණේ සමහර අයගේ ඡන්ද ලැබුණු බව පැහැදිළි කරන ලදී. සියලු දෙනාගේම ඡන්ද වලින් ජයග්‍රහණය කළ බවත් එතනින් නතර නොවී මහමැතිවරණයකට ගිය බවත් අපි ආසන 2/3 ක බලයක් ලැබුණු බවත්

ප්‍රකාශ කරන ලදී. අපි මහින්ද රාජපක්ෂ සමඟ දේශපාලනය කළද ගෝඨාභය රාජපක්ෂගේ දේශපාලන න්‍යාය පිළිබඳව අපි සම්බන්ධ නොවුණු බවත් අපි සියලුදෙනාගේ බලාපොරොත්තුව පිට යම් යම් විශ්වාසයක් තිබූ බවත් මෙම ආණ්ඩුව හරියට වැඩ කරාවි යැයි චේතනාව උඩ මේ සියල්ල කළ බවත් පැහැදිළි කරන ලදී. නමුත් වෙල්ගම මහතා සෘජුවම ගෝඨාභය රාජපක්ෂ මහතාට ඡන්දය දෙන්න එපා යැයි පැවසූ බවත් ඔහු පවසා සිටියේ ගෝඨාභය රාජපක්ෂ මරණාධාර සමිතියකවත් සභාපති කෙනෙක් වී නොසිටී නිසා දේශපාලනය නොදන්නා බවයි. නමුත් අපි එසේ අසන්නේ නැතිව ඡන්දය ලබා දී ජයග්‍රහණය කරවූ බව ප්‍රකාශ කරන ලදී. මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති වූ පසු සියලුම අමාත්‍යංශ හා ලේකම්වරු මාරු කළ බවත් ගෝඨාභය රාජපක්ෂ ද ජනාධිපතිවූ පසු එසේ සිදු කළ බවත් නිලධාරින් මාරු කළ බවත් සමහර නිලධාරීන් වැඩ නොකර සිටි බවත් ප්‍රකාශ කරන ලදී. රණවිරුවන්ට අගෞරව නොකරන බවත් තරු දාගත් පුද්ගලයන් පැමිණි විට තේජස් පෙන්වන බවත් නිලධාරීන්ව බය කරලා ජනතාව බය කරලා මේක හරි මාර්ගයකට ගනිවී යැයි සිතන බවත් නමුත් දේශපාලන සත්‍ය ලෙස දකින්නේ එය නොවන බවත් පෙන්වා දෙන ලදී. මිනිසුන් සිවිල් ජනතාව ලෙස එකතු වී කරන යම් යම් කැපකිරීම් ඉස්සරහට ගෙන යායුතු බවත් පෙන්වා දෙන ලදී. නමුත් අපි කවුරුත් දන්නේ අර ඉහළ නිලධාරියා පහළ ඉන්න අයට නියෝග ලබා දෙන බවත් නමුත් මන්ත්‍රීවරයෙක් මහජන නියෝජිතයෙක් වූ විට මහජනතාවට ඔය කියන නියෝග ලබා නොදිය යුතු බවත් නියෝග වලට ඔවුන් වැඩ නොකරන බවත් ප්‍රකාශ කරන ලදී. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නියෝග ලබා දී වැඩ කරාවි යැයි අප සිතූ බවත් සමහර ආයතනවලට ගොස් මහා විප්ලවයක් කළ බවත් අප සිතුවේ රට හරියට හදාවී කියා බවත් ප්‍රකාශ කරන ලදී. මේ ආයතනවලට ගොස් සියලු දේ සොයා බලාවී යැයි සිතූ බවත් නමුත් ඒක ටික කාලයක් එම යාන්ත්‍රණය ඉදිරියට නොගිය බවත් ප්‍රකාශ කරන ලදී. අපි එම වැඩපිළිවෙලට සතුටු වී සිටිය බවත් ජනතාවත් සතුටින් ඒ දිහා බලා සිටි බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් අද අපට ගොස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට ගොස් වැඩක් කරගැනීමට නොහැකි බව ප්‍රකාශ කරන ලදී. අපට වැඩක් කරදී ඔවුන් යමක් අපෙන් බලාපොරොත්තුවන බවත් මේ රට තුළ ඉතා දරුණු ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වන බවත් ඒ රාජ්‍යත්‍රස්තවාදය බවත් පෙන්වා දෙන ලදී. ඒක අභිබවා යාමට බැරි ප්‍රධාන හේතුව වෘත්තීය සමිති ව්‍යාපාර බවත් වෘත්තීය සමිති ව්‍යාපාර හැම පක්ෂයකටම තිබෙන බවත් පෙන්වා දෙන ලදී. අරගලය හෝ මොනයම් හේතුවකින් හෝ මේ රට හැදෙනවානම් මේ වෘත්තීය සමිති ව්‍යාපාර සමස්ථ පද්ධතියෙන්ම අතුගා දැමිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කෝටි ගණන් නාස්ති වන සියලු ආයතන පෞද්ගලිකකරණය කළ යුතු බව මාගේ මතය වන බවත් පෙන්වා දෙන ලදී. සියලු ආණ්ඩු විසින් ණය ලබා ගෙන ඒවා නොගෙවා ගිය බවත් ඒවාට වගකියන්නට සිදුවූයේ ගෝඨාභය රාජපක්ෂ මහතාට බවත් පෙන්වා දෙන ලදී. ඉදිරියට එන කෙනෙක් ඒ ආකාරයෙන්ම එම ව්‍යවස්ථාවට කටයුතු කරනවානම් කිසිම ප්‍රයෝජනයක් නැති බවද පෙන්වා දෙන ලදී. මේ රට හදන්නටනම් ප්‍රතිව්‍යුහගත කළ යුතු බව පෙන්වා දෙන ලදී. කෙනෙකුට ජීවත් වීමට හැකිවන පරිදි වැටුප් තල ගෙනා යුතු බව පෙන්වා දෙන ලදී. ජනතාව ඉල්ලා සිටින දේට අපි විසින් යම් නැඹුරුතාවක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. නොඑසේ සිදුවුවහොත් මෙම අරගලය නිම නොවන බවත් පෙන්වා දෙන ලදී. නමුත් මේ සියල්ලම සිදුවිය යුත්තේ රටේ නීතියට බවත් පෙන්වා දෙන ලදී. රටේ නීතිය කාටවත් අතට ගත නොහැකි බවද පෙන්වා දෙන ලදී. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය තුමාට සුභ පතන බවත් කවුරුත් නොමැති වෙලාවට ගිලෙන නැවකට ඔහු නැගී බවත් ඔහු දක්ෂයෙක් නම් මෙය ගොඩගනීවී යැයි ප්‍රකාශ කරන ලදී. දැන් තෙල් ටික පොහොර ටික යම්තාක් දුරට ලැබෙන බවත් එමඟින් ජනතාවගේ පීඩනය යම්තාක් දුරකට අඩුවේවි යැයි විශ්වාස කරන බවත් පෙන්වා දෙන ලදී. වසර 05 කට ආසන්න කාලයක් විවිධ හැලහැප්පීම් මධ්‍යයේ මේ සභාව කරගෙන ගිය බවත් සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී. මේ ප්‍රදේශයේ ජනතාවටත් ස්තූතිය පුදකරන බව ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් ප.ව.2.10 ට ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමාට මූලාසනය භාර දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මහතා**

ගරු සභාපතිතුමනි, දේශපාලනිකව පත් වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව ආවේගශීලිව තර්කානුකූලව පක්ෂවලට චෝදනා කරගනිමින් කතා කළ බවත් තමන්ගේ නායකයාට චෝදනා කරන විට හරියට රිදුනු

බවත් තමන් නියෝජනය කරන පක්ෂයට චෝදනා කරන විට ගොඩක් රිදුනු බවත් පෙන්වා දෙන ලදී. රංජිත් මන්ත්‍රීතුමාගේ කතාව අසාගෙන සිටින විට පොඩි අදහසක් පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී. මේ ඉතිහාසයේ සිටින අරගලකරුවා යන්න විග්‍රහ කිරීමේදී හදවතින් සද්භාවයෙන් මේ මිනිසුන්ගේ රට ආකල්ප නිවැරදි දිශාවකට ගෙන යාමට යම් පිරිසක් උත්සාහ ගත් බවත් යම් තැනකදී දිශානතිය වෙනස් වී ඇති බවත් දැන් අවසානය කොතනදැයි අරගලකරුවා වත් නොදන්නා බවත් එය අපට පෙනෙන්නට නොමැති බව පෙන්වා දෙන ලදී. මම දකින ආකාරයට දැනට පවතින පක්ෂවල කිසිම කෙනෙකුට මේ රට ගොඩනැගීමට අවශ්‍යතවයක් හෝ ජනතාව දුක්විදින එක නැති කරන්නට හෝ මේ රටේ සුභ සිද්ධිය හදන්නට ඕන කියන දේ පිළිබඳ කිසිම අදහසක් නොමැති බව අද පැහැදිළි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. යම් තැනකදී රට අස්ථාවර වූ වෙලාවක හිටපු ජනාධිපතිතුමා අගමැතිකම භාර ගන්න කියූ අවස්ථාවේ හදවතින්ම මේ රට ගොඩනගන්නට ඕන යැයි හැඟීමක් තිබුණානම් එම අවස්ථාවේ අගමැතිකම භාර ගන්න තිබූ බවත් නමුත් මේ අවස්ථාවේ තමන්ට තිබෙන බර බලලා තමන්ට තිබෙන වාසිය බලලා තමයි තමන් එම අගමැතිකම ගන්නවාද යන්න තීරණය කළ බවත් පැහැදිළි කරන ලදී. මම ස්වාධීන මන්ත්‍රීවරයෙකු බවත් මට පක්ෂ දේශපාලනයක් නොමැති බවත් හරි දේට හරි හා වැරදි දේට වැරදි යැයි ප්‍රකාශ කරන බවත් පැහැදිළි කරන ලදී. රට අගාධයකට වැටී ඇති මොහොතක රනිල් වික්‍රමසිංහ මහතා ඒ අවස්ථාවේ දී දූවන කෝච්චියට බෙල්ල තැබූවා වැනි දෙයක් සිදු කළ බවත් මේ තිබෙන තත්ත්වයෙන් ගොඩ ගැනීමට හෝ මෙවැනි මොහොතකට එතුමා ඉදිරිපත් වී අග්‍රාමාත්‍යකම භාර ගැනීම පිළිබඳ මා සතුටු වන බවත් ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මේ අවස්ථාවේදී එක පක්ෂයකට විතරක් මේ ආණ්ඩුව රැගෙන වැඩ කරන්නට නොහැකි බවත් පෙන්වා දෙන ලදී. ඉතිහාසයේ සිට ගෙඩිය පිටින් අරන් දේශපාලනය කර රට ගොඩ නගන්නට හැකි දැයි බැලූ බවත් පෙන්වා දෙන ලදී. හොඳ හා නරක තීන්දු තීරණ දේශපාලනික වශයෙන් ගත් තීන්දු තීරණ නිසා රටට මුදල් අහිමි වී ඇති බවත් අහිමි වී ඇති ජීවිත තිබෙන බවත් පෙන්වා දෙන ලදී. නමුත් මේ සමස්ථයටම කතා කරන මාගේ සිත සභාවේ සියලුම දෙනා රාජ්‍ය යාන්ත්‍රණයේ සිටින සියලුම නිලධාරීන් සියලුම දෙනා වගකිව යුතු බව පෙන්වා දෙන ලදී. පක්ෂ පාට අපේ නායකයන් වෙනුවෙන් කඩේ ගොස් මේ රට අද මේ තත්ත්වයට පත් වී ඇති බවත් කොහේ හෝ වැරදී ඇති බවත් මාධ්‍යයත් මෙයට වගකිව යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කම්කරු නායකයින්ගේ යුතුකම් හරියට කරාදැයි සැකයක් මතුවන බවත් එයට හේතුව ලෙස මාධ්‍යයට දේශපාලනඥයන් ගෙන්වන බවත් නොඑසේනම් රාජ්‍ය පරිපාලනය ගෙන යන බවත් අවසානයේදී ගුටි බැටයකින් මතවාදයකින් හරි එය අවසන් වන බවත් නමුත් කිසිම කැබිනට් ඇමතිවරයෙක් හරි කිසිම කෙනෙක් රට දිනවන සාකච්ඡාවක් නොකරන ලද බවත් තමන්ගේ අදහස පමණක් දිනවා ඇති බවත් පැහැදිළි කරන ලදී. යම්කිසි එකඟතාවයකට පත්වී නික්මුණු අවස්ථා අප විසින් දැක නැති බවත් පෙන්වා දෙන ලදී. රටේ සුභ සිද්ධිය වෙනුවෙන් කිසිම මතයක් ජයග්‍රහණය කර නැති බව පෙන්වා දෙන ලදී. අද කම්කරු නායකයින් කියන අයත් පක්ෂ වලට බෙදී තමන්ගේ අරමුණු වලට යන්න දඟලන බවත් ඔවුන්ගේ යුතුකම් ඉෂ්ට කර නැති බවද පෙන්වා දෙන ලදී. විපක්ෂය ජනතාවගේ දුක වෙනුවෙන් ඉදිරිපත් වූවාද යන්න ගැටළු තිබෙන බවත් ඇත්තටම ජනතාවගේ දුක ගැන හිතනවානම් මේ පක්ෂ සියල්ල එකතුවී රට ගොඩනගන්නට අවශ්‍ය කාරණා අදහස් ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වා දෙන ලදී. නමුත් මේ සියල්ලම දෙස බාහිරින් බලා ඉන්න අපට පෙනෙන්නේ, කැමක් වැටුණු තැනකට කුලල් කාගන්න තැනක් ලෙස පෙනෙන බවයි. දේශපාලනඥයින්ගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ අත් පිරිසිදු නොවන බවත් සියලු දෙනාගේම වැරදි තිබුණ බවත් මේ වේලාව අනිත් අයගේ වැරදි කතා කරන වේලාවක් නොවන බවත් සියලු රාජ්‍ය නායකයින්ගෙන් ඉල්ලා සිටින්නේ එකතු වී මේ රට ගොඩනගන්නට දායක වෙමු යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඩබ්. රාණි මැණිකේ මිය**

ගරු සභාපතිතුමනි, අපි මොනවා කතා කළත් ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරක් නොලැබෙන බවත් නමුත් අද ජනතාව විඳින දුක මේ දොරෙන් එළියට බැස්ස විට අපිත් ඒ තැනට පත් වී ඇති බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මේ රටේ ඇති වී තිබෙන බේදවාචකය පාට පක්ෂ භේදයකින් තොරව භාර ගෙන කටයුතු කරන්නට ලැබේවා යැයි ප්‍රාර්ථනා කරන බවත් ප්‍රකාශ කරන ලදී. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් කෙරුණු නිමල් බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවට පත් වී පැමිණි දර්ශන නුවන් මන්ත්‍රීතුමා පක්ෂය වෙනුවෙන් පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

මූලාසනය.

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2022.08.09 වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදි. එදින ප.ව. 2.35 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදි.

ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන.

2022/08/09 දින රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදි.

ගරු සභාපති.